


# FTZ
# අරගලයට යුක්තිය

## වියරු මර්දනයට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පිළිතුරු

නීතිඥ දුලාන් දසනායක

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

# FTZ
# අරගලයට යුක්තිය

වියරූ මර්දනයට
ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පිළිතුරු

# FTZ
# අරගලයට යුක්තිය

## වියරු මර්දනයට
## ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පිළිතුරු

**නීතිඥ දුලාන් දසනායක**

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

# FTZ
# අරගලයට යුක්තිය

වියරු මර්දනයට
ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පිළිතුරු

**මුද්‍රණය - 2019**

**කර්තෘ**

නීතිඥ දුලාන් දසනායක

**ප්‍රකාශනය**

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය
අංක 07, කොපියාවත්ත පාර, කොළඹ 09.
දුරකථනය/ෆැක්ස් : 011 266 9100
ඊමේල්: right2lifelk@gmail.com වෙබ්: www.right2lifelanka.org

**සෝදුපත්**

නදීශානි තිලකරත්න

**පිටු සැකැස්ම, කවර නිර්මාණය හා මුද්‍රණය**

adARTS
If you can imagine it, we can create it.
Designing and Printing

No. 111, 1/1, Old Road, Navinna, Maharagama.
Tel: +94 11 310 3181, +94 76 610 6467
Email: adartsdp@gmail.com

# පෙරවදන

විනයානුකූල රටක් සඳහා ශක්තිමත් පාලකයෙක් අවශ්‍ය බවට කතිකාවක් සමාජය තුළ මේ වන විට නිර්මාණය වී ඇත. මේ ශක්තිමත් පාලකයා අවශ්‍යය යන ජනප්‍රිය ප්‍රවාදය අපේක්ෂා කරන්නේ මහජන අයිතිවාසිකම් උල්ලංඝනය කරන වෘත්තීය සමිති අයිතිවාසිකම් නොතකන පාලකයෙකි. ඒ පාලකයා සියලු වෘත්තීය ගැටලු, මහජන ඉල්ලීම් යටපත් කරමින් උද්ඝෝෂණ වර්ජන යටපත් කරමින් කටයුතු කරන නමුත් ඉහළ මධ්‍යම පන්තියට හා ධනේශ්වර ප්‍රභූ පන්තීන්ට සුවිශේෂී වරප්‍රසාද සලසන අයෙකි. දුම්රිය වර්ජනය මගින් මහජනයා පීඩාවට පත්වන විට සමාජය ඉල්ලන්නේ එකී ඉල්ලීම්වලට ඇහුම්කන් දෙන පාලකයෙක් නොව එකී ඉල්ලීම් මර්දනය කරන පාලකයෙකි. සෞඛ්‍ය වර්ජන ඇතුළු සියලු වර්ජනවලදී ද එසේ ම ය. ඇතැම් වර්ජනවල ඇති අවස්ථාවාදී දේශපාලනයත් මේ මොහොතේ අමතක කළ යුතු නැත. කෙසේ නමුත් කුමන තත්ත්වයක් යටතේ වුවත් මර්දනයට මහජනයා විරුද්ධ විය යුතු ය. අපේ මතය එය යි. වර්ජනයක දේශපාලන අවස්ථාවාදයක් තිබුණ ද එකී වර්ජනයන් වෘත්තීය අයිතිවාසිකම් යටපත් කරමින් ශිෂ්ට ලෝකයට නොගැළපෙන අයුරින් මර්දනය කිරීම සිදු නොකළ යුතු දෙයක් මෙන් ම සමාජයක් ලෙස ප්‍රතික්ෂේප කළ යුතු දෙයකි. මහජන උද්ඝෝෂණ පැවැතෙද්දී රථ වාහන තදබදය ඇති වෙද්දී මහජනයා අපේක්ෂා කරන්නේ මෙම උද්ඝෝෂණ රාජ්‍ය මර්දනය මගින් අවසන් කරනා පාලකයෙක් විනා එකී ඉල්ලීම්වලට සවන් දෙන පාලකයෙක් නොවේ.

ලංකාවේ සමාජයේ ඇති නිදන්ගත රෝගවලින් එකක් නම් මෙම ප්‍රචණ්ඩත්වය අනුමත කරන සමාජ මනෝභාවය යි. 'ගහන්නෙ නැතුව ළමයි හදන්න බෑ' යන සුප්‍රසිද්ධ පාඨය ලංකාවේ සමාජය තුළ පවතින්නක්. එය ගෙදර දෙමාපියන්ගේ සිට පාසල දක්වා ම ලංකාවේ සමාජයේ ජනතාව වෙත කා වැදී ඇත. විශ්වවිද්‍යාල තුළත් භාවිත වන ප්‍රචණ්ඩකාරී නවක වදය ලංකාවේ සමාජය වෙළාගෙන ඇති ප්‍රචණ්ඩත්වයට හොඳ උදාහරණයකි. ලංකාවේ ප්‍රවාහන සේවය ද වධහිංසාවෙන් ප්‍රචණ්ඩ ගතිවලින් පිරී ඇත. මේ සියලු කරුණු ද හේතු කොට ගෙන ලංකාවේ සමාජය ප්‍රචණ්ඩත්වයෙන් ප්‍රශ්න විසඳීමට උත්සහා දරයි. විනයානුකූල

රටක් ගොඩ නගන්න කියා ශක්තිමත් පාලකයකු අවශ්‍ය බවට සමාජයේ මතවාදයක් සැකසී ඇත්තේ ඒ නිසා ය.

වර්ෂ 2015 ජනවාරියේ දී සිදු වූ දේශපාලන පෙරළියට ජවය සැපයූ මතවාදය වූයේ ඒකාධිපති නායකයෙක් වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙක් අවශ්‍යයි යන්න යි. එකී දේශපාලන පෙරළියෙන් පසු ලංකාව මිනිස් අයිතිවාසිකම් විෂයෙහි ඉතා ඉහළ ප්‍රගතියක් වාර්තා කළේ ය. රජය හා රජයේ ප්‍රබලයන් විවේචනය කිරීමට ජනමාධ්‍ය ඇතුළු සියලු පුරවැසියන්ට හැකි විය. රජයේ හා පෞද්ගලික අංශයේ වෘත්තීය නිදහස ද වර්ධනය විය. විශේෂයෙන් රජයේ සේවකයන්ගේ වෘත්තීය නිදහස වර්ධනය විය. ඒ අනුව ඔවුන් තම ඉල්ලීම් දිනා ගැනීම සඳහා පෙර කිසි කලෙක නොවුණු ලෙස වෘත්තීය ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඔවුන් වෙත රාජ්‍ය මර්දනය පැමිණියේ නැත.

රටකට දැඩි පාලකයෙක් අවශ්‍යය යන මතවාදය සැකසීමට මෙම වර්ජන රැලි හේතු විය. යම් ජන කොටසක් සිය අයිතිවාසිකම් වෙනුවෙන් අරගල කරද්දී අනෙක් අය සිතන්නේ තමාට වන පීඩාව නිසා එය මර්දනය කළ යුතු බව යි. තමා වෙතට රාජ්‍ය මර්දනය පැමිණෙන තෙක් ජනයා එය අනුමත කරයි.

වර්ෂ 2015ට පෙර ලංකාවේ පැවතියේ යම් ආකාරයක ඒකාධිපති පාලනයකි. 18වන සංශෝධනය මගින් සියලු බලතල සංකේන්ද්‍රණය කරගත් ජනාධිපතිවරයෙක් බිහි වී සිටියේ ය. රටේ ඉහළ ම තනතුරුවලටත් ඉහළ අධිකරණවල විනිසුරු ධූරයන්ටත් පුද්ගලයන් පත් කිරීමේ තනි බලය ජනාධිපතිට අත්පත් කර ගෙන සිටින ලදි. රාජ්‍යයට විරුද්ධ මතධාරී මාධ්‍යවේදීන් හා වෙනත් විරුද්ධ මතධාරීන් ඝාතනයට හා වෙනත් ආකාරයේ හිංසනයන්ට ලක් විය. මාධ්‍ය ආයතන ද ගිනිබත් කරන ලදී. වෘත්තීය ව්‍යාපාර හා ශිෂ්‍ය ව්‍යාපාර මර්දනය කරන ලදී. මේ තත්වය තුළ ආණ්ඩුවට විරුද්ධ ව ඉදිරියට ඒමට මිනිසුන් බිය විය.

මෙවන් තත්වයක් තිබුණ ද මෙම ශක්තිමත් මර්දනකාරී ආණ්ඩුවට එරෙහි ව තීරණාත්මක අරගල කිහිපයක් ද නොබිය ව පැන නැගුණි. එම අරගල ද ඉතා විශාල රාජ්‍ය මර්දනයක් මගින් මැඩපැවැත්වුව ද

එකී අරගල මහා ශක්තිමත් ආණ්ඩුව දෙදරවීමට සමත් විය. අද ඇතැම් මිනිසුන් ඉල්ලන ශක්තිමත් පාලකයාගේ තරම පෙන්නූ අරගලයක් නම් කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ඇති වුණු වෘත්තීය අරගලය යි. එකී අරගලය එදා සිටි ශක්තිමත් පාලකයන් විසින් මර්දනය කළේ ඉතාමත් තිරශ්චීන ලෙස ය. මූලික අයිතිවාසිකම් කිසි ලෙසකින් මායිම් නොකර පාලකයන්ගේ ආශිර්වාදයෙන් සිදු කරන ලද මෙම මර්දනය විස්තරාත්මක ව මේ සම්බන්ධයෙන් පත් කළ මහානාම තිලකරත්න ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාවේත් එමෙන් ම මේ සම්බන්ධයෙන් වූ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේත් දැක්වෙයි.

වසර ගණනාවකට පසු මෙම සිදුවීමෙන් තුවාල ලැබූ පිරිසට මෙන් ම මෙම සිදුවීමෙන් රාජ්‍ය මර්දනයට හසු වූ සියලු දෙනාටත් එමෙන් ම පොදුවේ මහජනයාටත් යුක්තිය ඉටු කරමින් මෙම උද්ඝෝෂණය මර්දනය කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ ය. මූලික අයිතිවාසිකම් වනසන මිලිටරිමය ලක්ෂණ සහිත ශක්තිමත් පාලකයෙක් අපේක්ෂා කරන ඇතැම් පිරිස්වලට එකී ශක්තිමත් පාලනයක තරම මෙම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව පරිශීලනය කිරීමෙන් දැන ගත හැකි වනු ඇත.

එකී ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවත් මෙම සිදුවීම පරීක්ෂා කළ මහානාම තිලකරත්න ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාවත් පදනම් කරගනිමින් කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ඇති වූ අරගලය හා එය මර්දනය කිරීමට රජය ගත් ක්‍රියාමාර්ග හා ඒ මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳව මෙම කෘතියේ විස්තර කරයි. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු ඉංග්‍රීසි බසින් පළවන අතර තමන්ට හිමි මූලික අයිතිවාසිකම් කවරේ ද යන්නත් ඒවා උල්ලංඝනය කිරීමට අදාළ තත්ත්වයන් ස්වභාෂාවෙන් සාමාන්‍ය ජනයාට ඉදිරිපත් කිරීමට ද මෙහි දී අපේක්ෂා කරයි.

ජනයාට සැබවින් ම අවශ්‍ය වන්නේ මූලික අයිතිවාසිකම් වනසන, මාධ්‍ය නිදහස අහිමි කරන, වෘත්තීය අයිතිවාසිකම් අහිමි කරන, ප්‍රචණ්ඩත්වය අනුමත කරන හා රාජ්‍ය මර්දනය කෙරෙහි විශ්වාසය තබන

පාලකයෙක් නොව මූලික අයිතිවාසිකම් සුරකින, මාධ්‍ය නිදහස සුරකින, රාජ්‍ය මර්දනය විශ්වාස නොකරන, විවේචනයන්ට ඔරොත්තු දිය හැකි විවේචන ඉවසන පාලකයෙක් ය. ඔහුට ශක්තිය තිබිය යුතු වන්නේ ඉහත කී කාරණා සඳහා ය. ශක්තිමත් පාලකයාගේ තරම ජනයාට අවබෝධ වන්නේ රාජ්‍ය මර්දනය තමාගේ දෙපතුළ ළඟට පැමිණි විට දී ය.

මෙම කෘතිය රචනා කිරීමට අවස්ථාව ලබා දුන් රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ පිලිප් දිසානායක මහතා ද, කෘතිය රචනා කිරීමේ දී විවිධාකාරයෙන් සහයෝගය ලබා දෙමින් දිරිමත් කළ රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානයේ ව්‍යාපෘති කළමනාකරු ඇන්තනී විනෝද් සහෝදරයා ද, ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ දිල්හානි නුවරපක්ෂ සහෝදරිය ද, සෝදුපත් බලමින් සහය වූ නදීශානි තිලකරත්න සහෝදරිය ද ගෞරවයෙන් මෙහි දී ස්තුති පූර්වක ව සිහිපත් කරමි.

**දුලාන් දසනායක**
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය
අංක 07, කෝපියාවත්ත පාර,
කොළඹ 09.

Email: dulandasanayaka@gmail.com
දුරකථනඃ 0779477525, 0718130552

වර්ෂ 2019 ඔක්තෝබර් මස 23වන දින දී ය.

# පටුන

01. පසුබිම 1

02. පොලිසියේ මර්දනකාරී ක්‍රියාකාරීත්වය 5
පොලිස්පති මහින්ද බාලසූරිය
පොලිසියේ පහරදීම්

03. යුක්තිය වෙනුවෙන් සිවිල් සංවිධාන පෙරට 12

04. වින්දිතයන්ට යුක්තිය ඉටු කළ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව 16

පෙත්සම්කරුවන්

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව සේවකයන්ගේ කඩ
වී ඇති මූලික අයිතිවාසිකම්

සාමකාමී ව රැස්වීමේ නිදහස උල්ලංඝනය වීම

අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම

12 (1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම - සර්ව
සාධාරණත්වයේ අයිතිවාසිකම

මෙම සිදුවීමේ දී ඉහළ පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වය
හා රාජ්‍යයේ වගකීම

පසුවදන 39

# පසුබිම 1

රජය විසින් පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා ගෙන ඒමට සූදානම් වන විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල සඳහා වන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමත් සමඟ ඒ සම්බන්ධයෙන් දැවැන්ත විරෝධතා පෞද්ගලික අංශයේ සේවකයන් තුළින් පැන නැගුණි. නිදහස් වෙළඳ කලාප තුළ මෙම විරෝධතා ඉතා උත්සන්න මට්ටමක පැවතුණු අතර කටුනායක නිදහස් වෙළඳ කලාපය ඒ අතර ප්‍රබල විය. පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් සැකසීම පනතේ අරමුණ ලෙස රජය ප්‍රකාශ කළත් සේවකයන්ගේ හා වෘත්තීය සමිතිවල අදහස වූයේ එකී පනත සම්මත වුවහොත් එය ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල හා පාරිතෝෂිත වැනි දැනට පවතින විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් සඳහා දැඩි ලෙස බලපාන බව යි.

ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානය මෙම පනත් කෙටුම්පතට දැඩි විරෝධයක් දැක් වූ අතර ඒ පිළිබඳ සේවකයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද සංවිධානය කරන ලදී. වර්ෂ 2011 මැයි මස 24වන දින ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානය විසින් කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සේවකයන් 40000ක් පමණ සහභාගි කර ගනිමින් විරෝධතා ව්‍යාපාරයක් පවත්වන ලදී. පොලිසිය විසින් නගර සභා ක්‍රීඩාංගනය තුළ රැස්වීමට විරෝධතාකරුවන්ට ඉඩ ලබා නොදුන් බැවින් නිදහස් වෙළඳ කලාපයට යාබද 18 කණුව අසල මෙම විරෝධතාවය පැවැත්විණි. එනිසා ම දැඩි රථවාහන තදබදයක් ඇති වූ අතර දුම්රිය මාර්ගය ද විරෝධතාකරුවන් හරස් කරන ලදී. සීඝ්‍රව පොලිසිය හා විරෝධතාකරුවන්

අතර මේ අවස්ථාවේ දී ගැටුමක් ඇති වූ අතර පොලිසිය විසින් කඳුළු ගෑස් ප්‍රහාරයක් හා බැටන් ප්‍රහාරයක් දියත් කරන ලදී. විරෝධතාකරුවන් 30 දෙනෙක් පමණ මෙහි දී අත්අඩංගුවට ගත් අතර පසු ව ඔවුන් මුදා හරින ලදී. මේ ආකාරයට දිගින් දිගට ම සේවකයන්ගේ විරෝධතාවයන් වර්ධනය වූ අතර පොලිසියේ ප්‍රතිචාරය ද මර්දනකාරී විය. මෙම විරෝධතාවයේ දී එවක ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ රුව සහිත දැවැන්ත පුවරුවක් සේවකයන් විසින් බිම හෙළීම තිබූ තත්ත්වය අනුව වඩා සංකේතාත්මක හා බලපෑම් සහගත විය. එවකට රාජපක්ෂ මහතාගේ දැවැන්ත පුවරු (කටවුට්) රට පුරා ප්‍රදර්ශනය කිරීම සාමාන්‍ය දෙයක් වූ අතර ඒවාට කිසිදු හානියක් කිසිදු අවස්ථාවක ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ සිදු නොවුණි. මෙහි දී ප්‍රසිද්ධියේ මෙම සේවකයන් එකී පුවරුව බිම හෙළීම පැවැති පාලන තන්ත්‍රයට නොබිය ව එරෙහි වීමට සංකේතාත්මක ජවයක් සැපයී ය. මෙම විරෝධතාවන්හි උච්චතම අවස්ථාව එළඹුනේ 2011 මැයි මස 30වන දින යි.

මැයි මස 28වන දින එවකට කම්කරු ඇමති ගාමිණී ලොකුගේ, අදාළ විෂයට සම්බන්ධ නිලධාරීන් හා නිදහස් වෙළඳ කලාප සේවකයන්ගේ නියෝජිතයන් සමඟ රැස්වීමක් කටුනායක නිදහස් වෙළඳ කලාප පරිශ්‍රයේ පිහිටි ආයෝජන මණ්ඩල ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමෙන් පසු මෙම පනත් කෙටුම්පතට සහය දක්වන ලෙස සේවකයන්ගෙන් ඉල්ලා සිටින අත් පත්‍රිකා කිසියම් පිරිසක් විසින් නිදහස් වෙළඳ කලාපය තුළ බෙදා හරින ලදී. එකී අත්පත්‍රිකා තුළ එය ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානයේ ප්‍රකාශනයක් ලෙස දක්වා තිබුණු නමුත් එහි ලිපිනය ලෙස සඳහන් වූයේ අංක 301, ටී.බී. ජයා මාවත, කොළඹ යනුවෙනි. එය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන කාර්යාලයේ ලිපිනය බවට මෙම සිදුවීම පරීක්ෂා කිරීමට පත් කළ මහානාම තිලකරත්න ජනාධිපති කමිටු වාර්තාවේ දැක්වෙයි. (මහානාම තිලකරත්න පරීක්ෂණ කමිටු වාර්තාව 31 පිටුව.)

මැයි 29වන දින මෙම විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පතට සහය දක්වමින් පෝස්ටර් විශාල ප්‍රමාණයක් කටුනායක නිදහස් වෙළඳ කලාපය පුරා අලවා තිබුණි. මෙම පෝස්ටර් ඇලවූ හා අත්පත්‍රිකා බෙදූ නාඳුනන පිරිස්වලට නිදහස් වෙළඳ කලාපයට පිවිසීමට පොලිසිය කිසිදු බාධා කිරීමක් නොකරන ලදී. මේ තත්ත්වය තුළ සේවකයන්ගේ විරෝධය,

නොසන්සුන්තාවය තව තවත් වර්ධනය විය. මෙකී තත්ත්වයේ උච්චතම අවස්ථාව මැයි මස 30 දින උදා විය.

2011 මැයි මස 30වන දින උදෑසන 10.00ට පමණ නිදහස් වෙළඳ කලාප පරිශ්‍රය තුළ සේවකයන්ගේ විරෝධතා උද්ඝෝෂණ ආරම්භ විය. සේවකයන් 600ක පමණ ප්‍රමාණයකින් ඇරඹුණු විරෝධතාවයට වේගයෙන් තවත් සේවකයන් එක් විය. 4000ත් 5000ත් අතර ප්‍රමාණයක සේවක පිරිසක් මේ විරෝධතාවය තුළ පසු ව දක්නට ලැබුණි. සාමකාමී ව විරෝධතාවය ආරම්භ වුවත් සේවකයන්ගේ ආවේගය කෙමෙන් උත්සන්න විය. පොලිසිය දෙසට ගල් ප්‍රහාර එල්ල කිරීමක් ද සිදු වූ අතර තත්ත්වය දරුණු අතට හැරුණි. මෙහි දී ඇතැම් රජයේ ප්‍රදේශීය දේශපාලඥයන් පැමිණ සේවකයන්ගේ එකඟතාවයකින් තොර ව මෙම පනත සම්මත නොකරන බවට ප්‍රකාශ කළ ද ආණ්ඩුවෙන් විශ්වසනීය සහතිකයක් ලැබෙන තුරු සේවක විරෝධතාවය නතර නොවුණි. ගල් ප්‍රහාර එල්ල කිරීම දරුණු අතට හැරුණි. සේවකයන් පවසන්නේ ගල් ප්‍රහාරයන් පොලිසිය විසින් ද තමන් වෙත එල්ල කරන ලද බව යි. මහින්ද තිලකරත්න ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාවේ 7වන පිටුවේ CMU වෘත්තීය සමිතියේ සභාපතිවරයා සාක්ෂි දෙමින් සේවකයන් විසින් ගල් ප්‍රහාර පොලිසියට එල්ල කළ බව පිළිගනිමින් ප්‍රකාශ කරන්නේ පොලිසිය විසින් එල්ල කරන ලද ගල් නැවත සේවකයන් පොලිසිය දෙසට එල්ල කළ බව යි. ආණ්ඩුවෙන් පිළිගත හැකි විසඳුමක් ලැබීම ප්‍රමාද වීම හා අත්පත්‍රිකා හා පෝස්ටර් මගින් පනත් කෙටුම්පත සාධාරණය කිරීමක් ආණ්ඩුවේ සහයෙන් සිදු කිරීම නිසා ආණ්ඩුව කෙරෙහි සේවක විශ්වාසය බිඳ වැටී තිබුණි. මෙම උද්ඝෝෂණය වඩා ප්‍රචණ්ඩකාරී වීමට ප්‍රධාන හේතුව එය විය. මෙම විරෝධතාවය තුළ දී ආණ්ඩුවෙන් සාධනීය ප්‍රතිචාරයක් සේවකයන් බලාපොරොත්තු වූ අතර ආණ්ඩුව එය මගහරිමින් සිටින ලදී. මේ තත්ත්වය තුළ සේවකයන් වඩා ප්‍රචණ්ඩකාරී විය. සේවකයන් පවසන පරිදි පොලිසියෙන් ද ගල් ප්‍රහාර එල්ල වීමත් හේතු කොට ගෙන පොලිසිය කෙරෙහි ද දැඩි විරෝධයක් සේවකයන් තුළ තිබුණි. සේවකයන්ගේ ගල් ප්‍රහාර කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ගේට්ටු අංක IV සිට මීටර් 100ක පමණ දුරින් පිහිටි කටුනායක පොලිසිය වෙත ද එල්ල විය.

මේ අතරවාරයේ දරුණුතම පොලිස් ප්‍රහාරයක් සේවකයන්ට එල්ල විය. දරුණු කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කළ පොලිසිය බැටන් පොලු හා යකඩ පොලුවලින් ද සේවකයන්ට පහර දෙනු ලැබුණි. මේ අතරවාරයේ ජීව උණ්ඩවලින් වෙඩි තැබීම ද පොලිසිය විසින් සිදු කෙරුණි. විශාල සේවකයන් ප්‍රමාණයක් තුවාල ලැබීය. වෙඩි තැබීමෙන් ද තුවාල වූ සංඛ්‍යාව ඉතා ඉහළ විය. රොෂේන් චානක නම් තරුණයා ඝාතනය විය. සේවක විරෝධතාවය විසුරුණු පසු ද කර්මාන්ත ශාලා තුළට ඇතුළු වෙමින් ද සේවකයන්ට පොලිසිය දරුණු ලෙස පහර දෙනු ලැබීය. තුවාලකරුවන් රෝහල්වලට රැගෙන යාමට ද පොලිසිය බාධා කරන ලදී. ගම්වාසීන්ගේ සහයෙන් වෙළඳ කලාපයේ තාප්පයක් කඩා තුවාලකරුවන් රෝහල් කරා රැගෙන යන ලදී. ලංකා ඉතිහාසයේ දරුණුතම ම්ලේච්ඡ ගණයේ පොලිස් ප්‍රහාරයක් ලෙස මෙම ප්‍රහාරය ඉතිහාසයට එක් විය.

පොලිස්පතිවරයාට ඉල්ලා අස්වීමට සිදු වූ අතර ඔහු ව බ්‍රසීලයේ තානාපති ලෙස එවක ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් පත් කරන ලදී. ජනාධිපතිවරයා විසින් විනිසුරු මහානාම තිලකරත්න මහතාගේ සභාපතිත්වයෙන් ජනාධිපති පරීක්ෂණ කමිටුවක් මේ පොලිස් ප්‍රහාරය හා සිදුවීම ගැන සොයා බැලීමට පත් කරන ලදී. එහි වාර්තාව එම ආණ්ඩුව බලයේ සිටි කාලවකවානුව තුළ ම ප්‍රසිද්ධියට පත් නොකරන ලදී. මෙකී ප්‍රහාරය හේතුවෙන් රොෂේන් චානක නම් තරුණයාට අමතර ව තවත් සේවකයන් පිරිසක් ම ස්ථිර ආබාධිත තත්ත්වයට ද පත් ව සිටී.

# පොලිසියේ මර්දනකාරී ක්‍රියාකාරීත්වය 2

ඉහත විස්තර කළ මැයි 24වන දින පැවැති උද්ඝෝෂණයට දැක්වූ ප්‍රතිචාරයට වඩා දරුණු ප්‍රතිචාරයක් මැයි 30 දින උද්ඝෝෂණයට පොලිසිය විසින් දක්වන ලදී. එසේ දරුනු මර්දනකාරී ප්‍රහාරයක් එල්ල කිරීමට මුල සිට ම සූදානම් වූ බවක් කරුණු විශ්ලේෂණයේ දී පෙනෙයි. ඒ පිළිබඳ ව සවිස්තරාත්මක විග්‍රහයක් මහානාම තිලකරත්න ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාවේ දැක්වෙයි.

## පොලිස්පති මහින්ද බාලසූරිය

මැයි 24වන දින පැවැති උද්ඝෝෂණයෙන් පසු දිනක **පොලිස්පතිවරයාගේ** සේවකයන් දැනුම්වත් කිරීමේ නිවේදනයක් කටුනායක නිදහස් වෙළඳ කලාපය පුරා ඉංග්‍රීසි හා සිංහල යන භාෂා ද්විත්ත්වයෙන් ම නිකුත් කර තිබුණි. මහානාම තිලකරත්න ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාවේ 18වන පිටුවේ එහි වැදගත් කොටස් උපුටා දක්වයි.

එහි දැක්වෙන්නේ 'පොලිස්පතිවරයා හා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශයේ ලේකම්වරයා සමඟ හදිසි සාකච්ඡාවක් ඊයේ කොළඹ දී පැවැති බවත් ඒ අනුව මැයි මස 24වන දින 18 කණුව ප්‍රදේශයේ පැවැති උද්ඝෝෂණයේ දී සේවකයන්ගේ නීති විරෝධී රැස්වීම, නීතිය කඩ කිරීම් හා සේවකයන්ගේ හැසිරීම පිළිබඳ ඔවුන් බලවත් ලෙස අසතුටු බවත් පොලිස්පතිතුමා දන්වා සිටින බව' යි. එමෙන් ම පොලිස්පතිවරයා මෙහි දී තවදුරටත් විශේෂයෙන් දක්වන්නේ

මෙවැනි නීති විරෝධී හැසිරීම් **අනාගතයේ දී නොඉවසන** බව යි. (Further he expressed the repetition of such unlawful actions will not be tolerated in the future) (ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාව 18 පිටුව බලන්න.)

මෙම නිවේදනයේ දැක්වෙන.... අනාගතයේ දී නොඉවසන බව (Will not be tolerated) යනුවෙන් දැක්වීම පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වන ජනාධිපති පරීක්ෂණ කමිටුව සිය වාර්තාවේ කියා සිටින්නේ මෙය මගින් පොලිස් නිලධාරීන්ට අනාගත උද්ඝෝෂණ සඳහා සම්බන්ධ වන සිවිල් වැසියන්ට තමාට කැමැති ඕනෑම දෙයක් කිරීමට පොලිස් නිලධාරීන් පොළඹවනු ලබන බව යි. මෙම නිවේදනය පැහැදිලි ව ම මෙම පනත් කෙටුම්පතට සේවකයන්ගේ විරෝධය කවර ලෙසකින් හෝ මර්දනය කරන බවට සේවකයන් වෙත ආණ්ඩුව වෙනුවෙන් පොලිස්පතිවරයා විසින් කරනු ලැබූ අනතුරු ඇඟවීමකි. මෙවන් අනතුරු ඇඟවීම් තුළින් සිදු වූයේ ආණ්ඩුව විසින් මෙම පනත හකුලා නොගන්නා බවට සේවකයන්ට වැටහී යාමත් මෙය කුමන ක්‍රමයකින් හෝ සම්මත කරවා ගැනීමට ආණ්ඩුව උත්සාහ දරන බවත් සේවකයන්ට වැටහී යාමත් ය. මේ හරහා සේවකයන්ගේ ප්‍රකෝපය වර්ධනය වූ අතර ඒ හේතුවෙන් ම විරෝධතා ද ඉතා විශාල පිරිසක් සහභාගී වූ ආවේගශීලී විරෝධතා විය. මැයි 30 උද්ඝෝෂණය සේවකයන්ගේ මතයට ඇහුම්කන් දීමක් සිදු නොකරන රජයට එරෙහි දැවැන්ත විරෝධතාවයක් විය.

මැයි 30 උද්ඝෝෂණය හා සමස්ත ලෙස මෙම පනත් කෙටුම්පතට ඇති වී ඇති සේවක විරෝධය මුළුමනින් ම මර්දනය කිරීමට සියලු කටයුතු සූදානම් කර තිබුණි. එහි පළමු අනතුරු ඇඟවීම පොලිස්පතිවරයාගේ ඉහත නිවේදනය විය.

පොලිස්පතිවරයා නියෝජ්‍ය පොලිස්පති රවී විජේගුණවර්ධනට දුරකථනයෙන් අමතා මැයි 30වන දින උදේ 7.00වන විට කටුනායකට වාර්තා කරන ලෙස දන්වා තිබුණු බවත් සහකාර පොලිස් අධිකාරී නිලයේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලය දක්වා නිලධාරීන් 16 දෙනෙකු කටුනායකට කැඳවා තිබූ බවත් ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාවේ දැක්වෙයි. එමෙන් ම මෙම කමිටු වාර්තාවේ තවදුරටත් දැක්වෙන්නේ

පිටකොටුව, කොළඹ වරාය, වෙල්ල වීදිය, මෝදර, කොම්පඤ්ඤ වීදිය ආදී කොළඹ නගරයේ පොලිස් ස්ථානවලින් ද පොලිස් නිලධාරීන් කටුනායකට කැඳවා තිබූ බව යි. ගම්පහ දිස්ත්‍රික්කයේත්, පුත්තලම දිස්ත්‍රික්කයේත් ඕනෑ තරම් පොලිස් ස්ථාන තිබියදීත් මෙම පොලිස් ස්ථානවලින් පොලිස් නිලධාරීන් කැඳවූයේ ඇයි ද යන්න ජනාධිපති කමිටුව සිය වාර්තාවේ 20වන පිටුවේ දී ප්‍රශ්න කරයි.

මෙයට අමතර ව පොලිස්පතිවරයාගේ තවත් ක්‍රියාමාර්ගයක් මෙම කමිටුව ප්‍රශ්න කරයි. එම කමිටු වාර්තාවේ 19වන පිටුවේ දැක්වෙන්නේ ජල ප්‍රහාරක රථ මෙම ප්‍රදේශයට එවන ලෙස කිහිප අවස්ථාවක් පොලිස්පතිවරයාගෙන් ඉල්ලා ඇතත් පොලිස්පතිවරයා ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නැති බවට සාක්ෂි ඇති බව යි. ජනාධිපති පරීක්ෂණ කමිටුව ඉදිරියේ සාක්ෂි ලබා දෙන ප්‍රධාන පොලිස් පරීක්ෂක රත්නායක පවසන්නේ ජල ප්‍රහාරක රථ පහසුකම තිබුණේ නම් තත්ත්වය ඉතා පහසුවෙන් පාලනය කර ගත හැකි ව තිබූ බව යි. (ජනාධිපති කමිටු වාර්තාව 19 පිටුව බලන්න.) ඒ අනුව ජල ප්‍රහාරක රථ ලබා නොදීමෙන් බැටන් පොලු යකඩ පොලු ප්‍රහාරයකට හා ජීව උණ්ඩ ප්‍රහාරයකට පොලිසිය පෙළඹවීමක් මෙහි දී පොලිස්පතිවරයා විසින් සිදු කර ඇති බවට සැක මතු වේ.

## පොලිසියේ පහරදීම්

පොලිසිය විසින් විරෝධතාකරුවන්ට එරෙහි ප්‍රහාරය කඳුළු ගෑස් ප්‍රහාරයකින් ආරම්භ කරන ලද අතර බැටන් පොලු හා යකඩ පොලුවලින් ද විරෝධතාකරුවන්ට දරුණු ලෙස පහර දෙන ලදී. එපමණකින් නොනැවතුණු පොලිසිය විරෝධතාකරුවන්ට පහර දීමට ගිනිඅවි ද යොදා ගත්හ. ජීව උණ්ඩ මගින් විරෝධතාකරුවන් දෙසට වෙඩි තැබීම ද සිදු කෙරුණි. පොලිසිය නිදහසට කරුණු ලෙස කියා සිටින්නේ ඉතාමත් විශාල දරුණු ගල් ප්‍රහාර පොලිස් නිලධාරීන් දෙසට හා පොලිස් වාහන හා කටුනායක පොලිස් ස්ථානය දෙසට එල්ල වුණු බව යි. ජනාධිපති පරීක්ෂණ කමිටුව ප්‍රශ්න කරන්නේ මැයි 24වන දා සිටි කටුනායක නිදහස් වෙළඳ කලාපය අවට දිවා රෑ පොලිස් නිලධාරීන් විශේෂ රාජකාරි සිදු කරද්දී පොලිසිය කියන ආකාරයේ අති විශාල ගල් ප්‍රමාණයක් වෙළඳ

කලාපය තුළට රැගෙන ගියේ කෙසේ ද යන්න යි. (ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාව 17 පිටුව.)

ජනාධිපති පරීක්ෂණ කමිටුව අවධානය කරන අනෙක් කරුණ වන්නේ තුවාල ලබා සිටින පොලිස් නිලධාරීන්ගේ සංඛ්‍යාව යි. මහානාම තිලකරත්න ජනාධිපති කමිටු වාර්තාවේ 20වන පිටුවේ ඒ පිළිබඳ සවිස්තරාත්මක ව දක්වයි. එයට අනුව රෝහල් ගත කරන ලද සම්පූර්ණ පොලිස් නිලධාරීන් ගණන 22කි. ජූනි 04වන දින වන විට නියෝජ්‍ය පොලිස්පති රවී විජේගුණවර්ධන, සහකාර පොලිස් අධිකාරී ගුරුසිංහ පොලිස් පරීක්ෂක බන්දුල ඇතුළු නිලධාරීන් 05 දෙනෙක් පමණි, තුවාල ලබා ඇත්තේ. පොලිස් නිලධාරීන් මෙතරම් සුළු ප්‍රමාණයක් නම් එම ප්‍රමාණයෙන් සාතිශය බහුතරයක් දින දෙක තුනක් තුළ රෝහලෙන් ප්‍රතිකාර ලබා පිට ව ගොස් ඇත්නම් පොලිසියට සාමාන්‍ය ක්‍රමයක් අනුගමනය කරමින් විරෝධතාවය පාලනය කර ගැනීමට ඕනෑ තරම් අවස්ථාව තිබුණු බව පෙනෙයි. පොලිසිය පවසන ආකාරයේ පාලනය කර ගත නොහැකි ප්‍රහාරයක් සේවකයන්ගෙන් දියත් වූයේ නම් හානිය මෙතරම් සුළු නොවනු ඇත. මේ පොලිස් නිලධාරීන්ට සාපේක්ෂ ව විරෝධතාකරුවන්ට වුණු හානිය අති විශාල ය. පොලිස් වෙඩි තැබීමෙන් එක් අයෙක් මිය ගිය අතර අති විශාල ප්‍රමාණයක් තුවාල ලැබීය. පොලිසියේ පහරදීමේ පැවැති මර්දනකාරී බිහිසුනු ස්වරූපය එම සංඛ්‍යාවෙන් පෙනෙයි.

පොලිස් පරීක්ෂක රණසිංහගේ සාක්ෂියට අනුව ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාවේ දැක්වෙන්නේ දණහිසෙන් පහළට වෙඩි තැබීමට අණ ලැබුණු බව යි. එසේ අණ ලැබෙන විටත් සේවකයින් සිට ඇත්තේ අංක 4 ගේට්ටුවට හා පොලිස් ස්ථානයට බොහෝ දුරින් නිදහස් වෙළඳ කලාප පරිශ්‍රය තුළ යි. 'දණ හිසෙන් පහළට වෙඩි තබන්න' යැයි අණ ලැබුණු බව පැවසුව ද වෙඩි තැබීමෙන් තුවාල ලැබූ බොහෝ සේවකයන්ගේ තුවාල දණහිසට බොහෝ ඉහළින් තිබුණු බවට නිරීක්ෂණය විය. මෙම වෙඩි තැබීම්වලින් ඝාතනය වූ රොෂේන් චානකගේ වකුගඩුවලට ද වෙඩි වැදීමෙන් තුවාල සිදු වී තිබුණි. සිය සහෝදරිය නිවසට කැඳවා ගෙන ඒමට මෙම ස්ථානයට ගොස් සිටි මෙම සිදුවීමට කිසිදු සම්බන්ධයක් නොමැති පුද්ගලයකුගේ තුවාල වී තිබුණේ ඇස අසල යි. තවත්

පුද්ගලයකුගේ පසුපසට තුවාල සිදු වී තිබුණි (ජනාධිපති කමිටු වාර්තාව 17 පිටුව.). මෙයින් පෙනෙන්නේ දණහිසෙන් පහළට නොව පොලිසිය කිසිදු වගවිභාගයකින් තොර ව වෙඩි තබා ඇති බව යි. එමෙන් ම මෙම සිදුවීමට සම්බන්ධ නොවූ සිවිල් පුද්ගලයන්ට ද වෙඩි වැදී ඇත.

**කර්මාන්ත ශාලා ඇතුළට ද පැමිණි සිය ගණනක් වූ පොලිස් නිලධාරීන් ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සේවක සේවිකාවන්ට බැටන් පොලු, යකඩ පොලු, දම්වැල්, ලී පොලු ආදියෙන් දරුණු ලෙස පහර දුන් බව ජනාධිපති කමිටු වාර්තාවේ දැක්වේ. ගර්භනී සේවිකාවන් පවා මෙහි දී පොලිස් ප්‍රහාරයට ලක් විය.**

**කාන්තා පොලිස් කොස්තාපල්වරියන් අසභ්‍ය ලෙස සේවිකාවන්ට බැන වැදුණු බවත්, සේවිකාවන් අපචාරයට ලක් කරමින් ඔවුනට පහර දුන් බවත් කමිටු වාර්තාවේ 17 පිටුවේ දැක්වෙයි. මෙම කාන්තා පොලිස් කොස්තාපල්වරියන්ගේ හැසිරීම නින්දිත බවට මහානාම තිලකරත්න ජනාධිපති කමිටුව විශේෂයෙන් සඳහන් කරයි. සැඟව සිටි සේවිකාවන් එළියට ඇද ඔවුනට දණ ගැසීමට බල කළ බවත් ඔවුන් දණ ගස්වා ඔවුන්ට අපහාස කළ බවත් කමිටු වාර්තාව දක්වයි. එමෙන් ම ගර්භනී හා අසනීප වූ කාන්තාවන්ට ද පොලිසිය සිය අවි ඔසවනු ලැබූ බවත් මෙම වාර්තාවේ සඳහන් වෙයි (ජනාධිපති කමිටු වාර්තාව 19 පිටුව). එමෙන් ම මෙම කාන්තාවන් කටුනායක පොලිස් ස්ථානයට රැගෙන ගොස් නැවත නැවතත් පහර දුන් බව කමිටු වාර්තාවේ දැක්වෙයි.**

පොලිසිය මෙහි දී සේවකයන්ගේ ශරීරාංග බිඳී යන ලෙස දරුණු ලෙස පහර දී ඇති අතර එමෙන් ම ගර්භනී කාන්තාවන්ට ද පහර දී ඇත. එමෙන් ම සේවක සේවිකාවන්ව ආමානුෂික සැලකිල්ලකට හා දරුණු වධහිංසනයකට ලක් කර ඇත. කාන්තා පොලිස් කොස්තාපල්වරියන් ද සිය පුරුෂ පොලිස් සගයන්ට සහය වෙමින් ඒ ආකාරයෙන් ම ඔවුන්ගේ කටයුත්ත ඉටු කර ඇත. මෙම ප්‍රහාරයෙන් දැඩි ලෙස තුවාල ලබා ඝාතනය වූ රොෂේන් චානක රෝහලට රැගෙන ගිය වාහනයට ද පොලිසිය පහර දී තිබුණි.

කමිටු වාර්තාවේ 24වන පිටුවේ දැක්වෙන්නේ මැයි 24වන දින සිට තිබූ පොලිසියේ අසාමාන්‍ය හැසිරීම සේවකයන් ප්‍රකෝප කළ

බව යි. පොලිසියේ මෙම මර්දනකාරී ක්‍රියාකාරීත්වය මගින් පොලිස් දෙපාර්තමේන්තුව, රජය, රටේ ආර්ථිකය හා සමස්ත වශයෙන් රට ම අගෞරවයට පත් වූ බව කමිටු වාර්තාව කියයි.

සිය වාර්තාව සමාප්ත කරමින් කමිටු වාර්තාවේ සමාප්ත සටහනේ දැක්වෙන්නේ වෙළඳ කලාපයේ ප්‍රධාන දොරටුව වසාගෙන පොලිසියෙන් සිටි බැවින් පොලිසියට වඩා ගම් වැසියන් ශිෂ්ට සම්පන්න වෙමින් වෙළඳ කලාපයේ තාප්ප කඩා තුවාල ලැබූ සේවකයන් රෝහල් ගත කිරීමට සහය වුණු බව යි.

එම සමාප්ති සටහනේ තවදුරටත් දැක්වෙන්නේ ජල ප්‍රහාරක උපකරණ ආදී ප්‍රමාණවත් අවශ්‍ය පහසුකම් ලැබුණේ නම් මෙම තත්වය පාලනය කර ගැනීමට හොඳින් ම හැකියාව තිබූ බව යි. තුවාල ලැබූ සියලු දෙනාට ම වන්දි ලබා දිය යුතු බවත් කිසිදු දඬුවමක් ලබා නොදිය යුතු බවත් කමිටුව නිර්දේශ කරයි.

එමෙන් ම එම වාර්තාවේ තවදුරටත් දැක්වෙන්නේ රටට විශාල ආදායමක් ගෙන ඒමට දායක වන නිදහස් වෙළඳ කලාප සේවකයන්ගේ මූලික අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් භාවයකින් පොලිසිය කටයුතු කළ යුතු ව තිබුණු බව යි.

එමෙන් ම පොලිසිය දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය, පොලිස් ආඥා පනත මෙන් ම රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද උල්ලංඝනය කරමින් හැසිරී ඇති බව ජනාධිපති පරීක්ෂණ කමිටුව වැඩිදුරටත් පෙන්වා දෙයි.

තවදුරටත් ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාව පෙන්වා දෙන්නේ පොලිසිය අඩු ම තරමින් වෙඩි තැබීමෙන් පසු ව හෝ ඔවුන්ගේ අශිෂ්ට හැසිරීම නවතා දැමිය යුතු ව තිබුණු බව යි. පොලිසිය විසින් වාචිකවත් මෙන් ම යකඩ පොලු, යකඩ දම්වැල් පාවිච්චි කරමින් ක්‍රියාත්මක වීමත් වෙළඳ කලාප ආරක්ෂක නිලධාරියකුගේ රන් මාලයක් හා මුදල් සෙරකම් කිරීම ආදී ක්‍රියා කිරීමත් නීති ගරුක පුරවැසියන්ට ප්‍රශ්නගත වූ හා නීති ගරුක පුරවැසියන්ගේ සැලකිල්ලට ලක් වූ කාරණා බව ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාව කියයි.

මේ සිදුවීමට සම්බන්ධ වූ පොලිසියේ ඉහළ නිලධාරීන්ගේ සිට තනතුර නොසලකා සියලු පොලිස් නිලධාරීන් ආණ්ඩුවේ, අතිගරු ජනාධිපතිතුමාගේ, රටේ හා පොලිසියේ ප්‍රතිරූපයට හානි නොවන ලෙස කටයුතු කළ යුතු ව තිබුණු බව ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාව සමාප්ත කරමින් පරීක්ෂණ කමිටුව කියයි.

මේ ආකාරයට විනිසුරු මහානාම තිලකරත්න මහතාගේ සභාපතිත්වයෙන් ජනාධිපති පරීක්ෂණ කමිටුවක් සකස් කළ ද පොලිසියේ මෙම පහත් මර්දනකාරී ක්‍රියාකාරීත්වය පිළිබඳ කිසිදු සාධාරණ පරීක්ෂණයක් එවක ආණ්ඩුව විසින් සිදු නොකළ අතර මෙම පරීක්ෂණ කමිටු වාර්තාව මගින් දැඩි ලෙස දෝෂදර්ශනයට ලක් කර තිබෙන පොලිස්පතිවරයා ඉල්ලා අස් වීමෙන් පසු ඔහු ව ප්‍රභූ රාජ්‍යතාන්ත්‍රික ක්ෂේත්‍රයට ඇතුල් කරමින් බ්‍රසීලයේ තානාපතිවරයා බවට පත් කිරීමට එවක ජනාධිපතිවරයා කටයුතු කළේ ය. එවක ආරක්ෂක ලේකම්වරයාව සිටිමින් සුපිරි බලයක් හොබවමින් සිටි ජනාධිපති සොහොයුරු ගෝඨාභය රාජපක්ෂ මෙම සිදුවීම කිසි ලෙසකින් මායිම් කළේවත් නැත. ආණ්ඩුවට එරෙහි ව සිදු කරන මෙවන් විරෝධතාවලට සැලකිය යුත්තේ මේ ආකාරයෙන් බව අනුමත කරන හැසිරීමක් ඔහුගෙන් දිස් විය. මෙම ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාව පවා මහජනතාවට විවෘත කිරීමක් එවක රාජපක්ෂ ආණ්ඩුව විසින් සිදු නොකරන ලදී. පහර දීමෙන් තුවාල ලැබූ සේවකයන් හා සේවක වෘත්තීය සමිති කොතෙක් ඉල්ලීම් කළ ද මෙම වාර්තාව ඔවුන්ට ලබා නොදීමට ආණ්ඩුව ක්‍රියා කළේ ය. ආණ්ඩුවේ මෙම සැක සහිත හැසිරීමෙන් පෙන්නුම් කළේ මෙම ප්‍රහාරයන් එවක ආණ්ඩුවේ අවශ්‍යතාවය වෙනුවෙන් දියත් වූ වග යි.

ආණ්ඩුව මේ ආකාරයට කටයුතු කරද්දී මෙම ප්‍රහාරයෙන් මියගිය රොෂේන් චානක හා ප්‍රහාරයෙන් තුවාල ලැබූවන්ට, මානසික හා කායික වධහිංසාවට පත්වූවන්ට යුක්තිය ඉටු කර ගැනීමේ අරගලය ඇරඹුණි. සිවිල් සංවිධාන හා වෘත්තීය සමිති එකී අරගලයේ ඉදිරි පෙළ නියමුවෝ වූහ.

# 3 යුක්තිය වෙනුවෙන් සිවිල් සංවිධාන පෙරට

එවකට ඉතා බලගතු ආණ්ඩුවක් ව පැවැති මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආණ්ඩුවෙන් මෙම ප්‍රහාරයට යුක්තිය ඉල්ලා සිටීම සඳහා දැවැන්ත අභියෝගාත්මක අරගලයකට සිවිල් සංවිධාන එක් විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට උරුම ව ඇති නීතිය ඉදිරියේ සමානාත්මතාවයේ අයිතිය, වධහිංසාවෙන් හා කෲර හා අමානුෂික සැලකීම්වලින් මිදීමට ඇති අයිතිය, නීති විරෝධී අත්අඩංගුවට ගැනීම්වලින් වැළකීමට ඇති අයිතිය, භාෂණයේ හා ප්‍රකාශනයේ අයිතිය, වෘත්තීය සමිතිවලට සම්බන්ධ වීමේ අයිතිය, සමාගමයේ සාමකාමී ව රැස්වීමේ අයිතිය වැනි මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වූ මෙම නිර්ලජ්ජිත පොලිස් ප්‍රහාරයට එරෙහි ව යුක්තිය වෙනුවෙන් සිවිල් සංවිධාන එක් වූ අතර එයට දේශපාලන පක්ෂ, නීතිඥයන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ද සහය ලැබුණි. විවිධාකාරයේ දුෂ්කරතා හා තර්ජන මැද යුක්තිය උදෙසා සිවිල් සංවිධාන දිගින් දිගට ම කටයුතු කරන ලදී. මෙහි දී නිදහස් වෙළඳ කලාපීය සහයෝගිතා සංවිධානයේ ක්‍රියාකාරීත්වය කැපී පෙනුණි.

සිවිල් සංවිධාන මූලික ව මේ ප්‍රහාරයට එරෙහි ව කොළඹ ඇතුළු ප්‍රදේශ කිහිපයක උද්ඝෝෂණ සංවිධානය කරන ලදී. මේ සම්බන්ධයෙන් විවිධ සම්මන්ත්‍රණ ද සංවිධානය කරන ලදී. එමෙන් ම මෙම සිදුවීමට යුක්තිය ඉටු කර ගැනීම සඳහා සහ ආණ්ඩුවේ මෙවන් මර්දනකාරී ක්‍රියාකාරීත්වයන් වළක්වා ගැනීමේ අරමුණින් සෑම මසකම 01වන දා මෙම සිදුවීමට අදාළ ඇවරියවත්ත මංසන්ධියේ දී උද්ඝෝෂණ ව්‍යාපාරයක් අඛණ්ඩ ව වසර ගණනාවක් පැවැත්වීමට තරම් සිවිල් සංවිධාන

ශක්තිමත් විය. සාමාන්‍ය වටපිටාවක් තුළ එවන් විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වීම එතරම් අසීරු නොවුණ ද එම කාලයේ පැවති වටපිටාව තුළ ආණ්ඩුවට එරෙහි උද්ඝෝෂණ කිරීම සැබවින් ම අභියෝගාත්මක එකක් විය. විශේෂයෙන් ම ආණ්ඩුවේ කීර්ති නාමය බිංදුවට බැස්සවූ මෙම සිදුවීමේ වරද පොලිස්පති මත පටවමින් ඇඟ බේරා ගනිමින් මෙම සිදුවීම අමතක කරවීමට ආණ්ඩුව දැරූ උත්සහය තුළ මෙම සිදුවීම වසරක් පාසා මතක් කරවන ඉහත කී විරෝධතාවය රාජපක්ෂ ආණ්ඩුවට හිසරදයක් විය. එම නිසා ඒ හා සම්බන්ධ සිවිල් සංවිධානවලට හා පුද්ගලයන්ට නිරන්තරයෙන් තර්ජන එල්ල වුණු අතර එසේ වුව ද එම විරෝධතාවය අඛණ්ඩ ව ගෙන යාමට සිවිල් සංවිධාන සමත් විය.

මෙම සිදුවීමට අදාළ ව බිමේ අරගලය සිදු කරන අතර ම මෙහි වින්දිතයන්ට යුක්තිය ලබා දීම උදෙසා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩු පැවරීමට ද සිවිල් සංවිධාන කටයුතු කරන ලදී. ඒ අනුව මෙහි වින්දියන් වෙනුවෙන් විවිධ සංවිධාන එක් වෙමින් මූලික අයිතිවාසිකම් නඩු 13ක් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරීමට හැකියාවක් ලැබිණි. මූලික අයිතිවාසිකම් නඩු ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරීම ලේසි පහසු කටයුත්තක් නොවන අතර එකී නඩු සඳහා පෙනී සිටි නීතිඥයන්ගේ ද සහය ඇති ව එම නඩු 13 පැවරීමට සිවිල් සංවිධානවලට හැකි විය.

මෙම සිදුවීමට එරෙහි වීමෙන් පමණක් නොනැවතුණු සිවිල් සංවිධාන යළිත් එවැන්නක් ඇති නොවීම උදෙසා ද පුළුල් දේශපාලන පරිවර්තනයක් කිරීම උදෙසා ද අරගල කිරීම තවත් ජවයකින් යුතුව ඉදිරියට ගෙන යන ලදී. එවක තිබූ රාජපක්ෂ පාලනය ගමන් කරමින් තිබුණේ විරෝධතා නොඉවසන මර්දනකාරී ඒකාධිපතිත්වයකට ය. එයට එරෙහි ව ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම උදෙසා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන එන වැඩපිළිවෙළක් සහිත පරිවර්තනයක් අවශ්‍ය ව තිබුණි. ඒ සඳහා සිවිල් සංවිධාන නායකත්වය ගත් අතර එකී වැඩපිළිවෙළ සහිත දේශපාලන පරිවර්තනය 2015 ජනවාරියේදී සිදු විය. ඒ සඳහා සිවිල් සංවිධාන ඉතා විශාල කාර්යභාරයක් ඉටු කළ අතර මෙම කටුනායක සිදුවීම ද පැවැති ආණ්ඩුව දරුණු ලෙස අප්‍රසාදයට ලක් වීමට හේතුවක් විය.

2015 ජනවාරියේ දී දේශපාලන බලය පෙරළීමෙන් පසු ව ද සිවිල් සංවිධාන මෙම සිදුවීමට යුක්තිය ඉටු කර ගැනීම උදෙසා නොපසුබටව කටයුතු කරන්නට විය. මෙම සිදුවීම වැනි ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනි මිනිස් අයිතිවාසිකම් බරපතළ ලෙස උල්ලංඝනය වීම් වැළැක්වීම සඳහා විවිධ පියවරයන් ගන්නා ලෙසට ආණ්ඩුවට බලපෑම් කරන ලදී. නව ආණ්ඩුවේ ජනවරමට ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට අදාළ ප්‍රතිසංස්කරණ ඇති කිරීම ද ඇතුළත් විය. ඒ අනුව මානව හිමිකම් කොමිෂන් සභාව වඩා බලවත් තත්ත්වයකට පත් කරන ලද අතර ජාතික පොලිස් කොමිෂන් සභාව ඇතුළු තවත් කොමිෂන් සභා පිහිටුවනු ලැබීය. එකී කොමිෂන් සභා පිහිටවූවා පමණක් නොව ඒවා ස්වාධීන හා බලවත් තත්ත්වයකට පත් කරන ලදී. අගවිනිසුරුවරයා, පොලිස්පතිවරයා, නීතිපතිවරයා ඇතුළු රජයේ ඉහළ තනතුරු හා ඉහත කී කොමිෂන් සභාවන්හි සාමාජිකයන් පත් කිරීම ජනාධිපතිවරයාගේ තනි මතයට සිදු කිරීම නවතා දමා එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත සිදු කිරීමට අදාළ පසුබිම සැකසුණි. මේ මගින් මෙම තනතුරු පත් කිරීම් වඩා ස්වාධීන කිරීමට හැකි විය.

මෙම සිදුකරන ලද ප්‍රතිසංස්කරණ තුළ තොරතුරු දැනගැනීමේ පනත හඳුන්වා දීමත්, තොරතුරු දැනගැනීමේ අයිතිය මූලික අයිතියක් බවට පත් කිරීම අතිශය වැදගත් කරුණක් වූ අතර එය මෙම කටුනායක සිදුවීමට යුක්තිය ඉටු කර ගැනීමට යන මගෙහි දී ඉතා වැදගත් තීරණාත්මක එකක් විය. මෙවන් සිදු වීම් තුළ දී වින්දිතයන්ට යුක්තිය ඉටු කිරීම අසීරු වීමට ප්‍රබල හේතුවක් වන්නේ සිදුවීම පිළිබඳ නිසි තොරතුරු සොයා ගැනීමට නොහැකි වීම ය. තොරතුරු දැනගැනීමේ පනතේ ප්‍රතිපාදන අනුව තොරතුරුවලට ප්‍රවේශ වීමට සාමාන්‍ය ජනයාට අවස්ථාව ලැබී තිබේ.

**මෙම කටුනායක ප්‍රහාරයට අදාළ තොරතුරු සොයා ගැනීමට තිබූ වැදගත් ම වාර්තාව නම් ඒ සම්බන්ධයෙන් සෙවීමට පත්කළ මහානාම තිලකරත්න ජනාධිපති කමිටු වාර්තාව යි. මෙම වාර්තාව වින්දිතයන් හා සිවිල් සංවිධාන විසින් කොතෙක් ඉල්ලීම් කළ ද නොලැබුණි. මේ නිසා සිවිල් සංවිධාන ද මැදිහත් වෙමින් තොරතුරු දැනගැනීමේ පනත යටතේ අයදුම්පත්‍රයක් මිය ගිය රොෂේන් ශානකගේ මව විසින් ගොනු කරනු**

**ලැබූ අතර ඒ ඉල්ලීමට ප්‍රතිචාර ලෙස එම වාර්තාව ලැබුණි. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ සිදු කරන ලද පළමු ඉල්ලීම ලෙස මෙම ඉල්ලීම ඉතිහාසයට එක් වෙයි.**

ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව තුළ ද මෙම පරීක්ෂණ කමිටුවේ වාර්තාව බොහෝ සෙයින් සාකච්ඡාවට ලක් වී ඇත.

# වින්දිතයන්ට යුක්තිය ඉටු කළ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව 4

මෙම පොලිස් ප්‍රහාරයෙන් තුවාල ලැබූ සේවකයන් 13 දෙනෙක් කටුනායක පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා, සීදුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා, මීගමුව නියෝජ්‍ය පොලිස්පතිවරයා, හිටපු පොලිස්පති මහින්ද බාලසූරිය, හිටපු පොලිස්පති එන්. කේ. ඉලංගකෝන්, මෙම නඩු පවරන අවස්ථාවේ පොලිස්පති පූජිත ජයසුන්දර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා යුධ හමුදාවේ හමුදාපති ජගත් ජයසූරිය, හා නීතිපතිවරයා වගඋත්තරකරුවන් කරමින් ද මෙම පුද්ගලයන්ට අමතර SCFR 346/2011 නඩුවේ පමණක් එවක කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වගඋත්තරකරු කරමින් මූලික අයිතිවාසිකම් නඩු 13ක් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවරනු ලැබීය.

SCFR 265/11, 267/11, 269/11, 271/11, 273/11, 347/11, 348/11 යන මූලික අයිතිවාසිකම් නඩු 7 වෙනුවෙන් ජනාධිපති නීතිඥ ජේ. සී. වැලිඅමුණ මහතා ද SCFR 266/11 වෙනුවෙන් ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා ද SC FR 272/11 වෙනුවෙන් ශාන්ත ජයවර්ධන මහතා ද, SCFR 346/11 ජනාධිපති නීතිඥ ක්‍රිෂ්මාල් වර්ණසූරිය මහතා ද, SCFR 268/11 වෙනුවෙන් ජනාධිපති නීතිඥ උදිත ඉගලහේවා මහතා ද, SCFR 274/11 නීතිඥ ඉරාජ් ද සිල්වා මහතා ද SCFR 270/11 නීතිඥ නිරාන් අන්කටෙල් මහතා ද පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින ලදී.

ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් වූ ජනාධිපති නීතිඥ බුවනෙක අලුවිහාරෙ, ජනාධිපති නීතිඥ ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමන් හා අග්‍රවිනිශ්චයකාර එච්.ව එන්. ජේ පෙරේරා යන ත්‍රි පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ

විනිසුරු මඩුල්ල ඉදිරියේ විභාගයට ගැනුණු මෙම මූලික අයිතිවාසිකම් නඩුවේ තීන්දුව වර්ෂ 2019ක් වූ අප්‍රේල් මස 05 වන දින ලබා දෙන ලදී.

## පෙත්සම්කරුවන්

265/2011 මූලික අයිතිවාසිකම් අයදුම්පතෙහි පෙත්සම්කරු වූයේ එච්. එම්. එම්. සම්පත් කුමාර නම් අවුරුදු 19ක් වයසැති තරුණයා ය. මෙම තරුණ නිදහස් වෙළඳ කලාප සේවකයා ද විරෝධතා ව්‍යාපාරය හා සම්බන්ධ වූ අයෙකි. විරෝධතාකරුවන්ට පොලිසිය ප්‍රහාර එල්ල කරද්දී මොහු ආපසු හැරී දිව ගොස් ඇති අතර එසේ දිව යාමේ දී ඔහුට වෙඩි වැදී බිම වැටී ඇත. ඉන් පසු සහෝදර සේවකයන් ඔහු ව කර්මාන්තශාලාවක් ඇතුළට ඇදගෙන ගොස් ඇති අතර පසු ව මීගමුව මූලික රෝහලට ඇතුළත් කර ඇත. එහි දැඩි සත්කාර ඒකකයට ඇතුල් කළ මොහුගේ තුවාල දරුණු වීම හේතුවෙන් කොළඹ ජාතික රෝහලට මාරුකර යවනු ලැබී ය. මෙම වෙඩි ප්‍රහාරය හේතුවෙන් මෙම 19 හැවිරිදි තරුණයාගේ ප්‍රජනන පද්ධතිය හා ආහාර ජීර්ණ පද්ධතිය ස්ථිර ආබාධිත තත්වයට පත් වී ඇත.

266/2011 මූලික අයිතිවාසිකම් අයදුම්පතෙහි පෙත්සම්කරු වූයේ රෝහිත අමරසිංහ යි. පොලිස් ප්‍රහාරය දරුණු වීම හේතුකොට ගෙන සේවකයන් ඉන් බේරීමට කර්මන්ත ශාලාවලට දිව ගිය බවත්, ඉන් පසු සියගණනක් පොලිස් නිලධාරීන් කර්මාන්ත ශාලා තුළට කඩා වැදුණු බව ඔහු පෙත්සමේ දක්වා සිටී. එමෙන් ම තවදුරටත් ඔහු දක්වන්නේ පෙත්සම්කරු අනෙක් සේවකයන් ද සමඟ විවිධ භාණ්ඩ දමා ඇති කාමරයක් තුළට (Locker room) ගොස් එය අගුළු දමා ගෙන සිටිය ද කර්මාන්ත ශාලාව තුළට පැමිණි පොලිස් නිලධාරීන් එහි දොර කඩා ඔවුන් ව එළියට ඇද ගෙන ආ බව යි. මේ අවස්ථාවේ දී සේවිකාවන්ව ද එලෙස ම ඇද ගෙන ආ පොලිස් නිලධාරීන් ඔවුන්ට දණ ගැසීමට බල කළ බවත් ඔහු කියා සිටී. මෙයට එරෙහි ව පෙත්සම්කරු මැදිහත් වීමට ගිය අවස්ථාවේ පෙත්සම්කරුට යකඩ පොලුවලින් හා පයින් පහර දුන් බවත් පසු ව පෙත්සම්කරුව තවදුරටත් රඳවා ගත් පොලිස් නිලධාරීන් ඔහුට බිත්තියකට ප්‍රතිවිරුද්ධව හිට ගැනීමට සලස්වා රබර් හෝස් එකකින් පහරදුන් බව පෙත්සම්කරු කියා සිටී. ඉන් පසු පෙත්සම්කරුව

එම කර්මාන්ත ශාලාවේ මානව සම්පත් කාර්යාලයට ඇද ගෙන ගිය බවත් එහි පෙත්සම්කරු මෙන් ම තවත් තුවාල ලැබූ සේවකයන් සිටි බවත් පෙත්සම්කරු ද සමග ඔවුන් කර්මාන්ත ශාලාවට අයත් වෑන් රථයකින් මීගමුව රෝහල වෙත රැගෙන ගිය බවත් පෙත්සම්කරු ප්‍රකාශ කර සිටී.

267/2011 මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරු වූයේ බුද්ධික අතපත්තු යන අය යි. මෙම පෙත්සම්කරු ද ඉහත පෙත්සම්කරු මෙන්ම විරෝධතාවට එරෙහි පොලිස් ප්‍රහාරය එල්ලවද්දී කර්මාන්ත ශාලාවක් තුළට දිව ගොස් තිබූ අතර පෙත්සම්කරු හා තවත් එහි සිටි සේවක පිරිස් හට පොලිසිය විසින් එහි දී යකඩ පොලු , යකඩ දම්වැල් හා කර්මාන්ත ශාලාවේ නිෂ්පාදිත ට්‍රාන්ස්ෆෝමර් කොටස්වලින් පහර දුන් බවත් ඒ හේතුවෙන් මෙම පෙත්සම්කරුට දරුණු තුවාල සිදු වූ බවත් ඔහු පෙත්සමේ දක්වා සිටී. ඉන් පසු ඔහු ව මීගමුව මූලික රෝහල වෙත රැගෙන ගොස් ඇත.

268/2011 මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරු වූයේ ධනුෂ්ක සංජීව යන අය යි. පොලිස් ප්‍රහාරයත් සමග ඒටීජී ග්ලවුස් කර්මාන්තශාලාව තුළට පෙත්සම්කරු හා තවත් අය දිව ගිය අතර එම කර්මාන්ත ශාලාවේ අංශ ප්‍රධානී හා පෙත්සම්කරු එක් ව ඔවුන් සිටි ගොඩනැගිල්ල අගුළු දමන ලද බව මෙම පෙත්සම්කරු කියා සිටී. ඉන් පසු පොලිස් නිලධාරීන් දොර විවෘත කරන ලෙස බලකරන ලද අතර දොර විවෘත නොකළ බැවින් පොලිසිය ලීයෙන් හා වීදුරුවලින් නිමවා තිබූ කොටස් පහර දෙමින් විනාශ කරන ලදී. එම නිසා අංශ ප්‍රධාන විසින් දොර විවෘත කළ අතර ඒ අවසරයෙන් කර්මාන්ත ශාලාව තුළට පැමිණි පොලිස් නිලධාරීන් පෙත්සම්කරුට හා අනෙක් සේවකයන්ට දරුණු ලෙස පහර දී ඇත.

269/2011 මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරු වූයේ අනේෂ් ඉමල්ක ෆර්නෑන්ඩු යන අය යි. පොලිස් පහරදීම සිදුවද්දී කර්මාන්ත ශාලාවක් තුළට දිව ගිය මෙම පෙත්සම්කරු පොලිසිය කර්මාන්ත ශාලාව තුළට පැමිණීමට ප්‍රථම ජනේලයකින් පැන යාමට සමත් වී ඇත. එනමුත් තවත් පොලිස් නිලධාරීන් පිරිසක් විසින් ඔහු ව

අල්ලාගෙන ඇති අතර පොලිස් නිලධාරීන් දෙදෙනෙක් ඔහු ව අල්ලා ගෙන සිටිය දී අනෙක් පොලිස් නිලධාරීන් විසින් ඔහුට දරුණු ලෙස පහර දී ඇත. එම පහර දීමෙන් පසු ව ඔහු ක්ලාන්ත වී බිම වැටී ඇති අතර ඉන් පසු ද ඔහුට පහර දී ඇත. පසු ව ඔහුට යකඩ පොලුවලින් ද පහර දී ඇත. මොහුගේ එම්එල්ආර් වාර්තාවේ (Medico Legal Report) දක්වා ඇත්තේ මොහුගේ තුවාල දරුණු නොවූව ද නළල ප්‍රදේශයේ ඇති වී ඇති කැළල සුව වීමෙන් පසුවත් පවතින බැවින් මුහුණේ විරූපී තත්වයක් ඉන් ඇතිවන බැවින් එය දණ්ඩ නීති සංග්‍රහයේ 311 වගන්තිය යටතේ ගැනෙන බරපතළ තුවාල සිදු කිරීමක් යටතට ගත හැකි බව යි.

270/2011 මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරු වූයේ එන්. එල්. ටී. ඉරේෂා යන අය යි. ඇය ද විරෝධතාවයට පොලිස් ප්‍රහාරයට එල්ල වූ අවස්ථාවේ කර්මාන්ත ශාලාවක් තුළට තවත් විරෝධතාකරුවන් සමග දිව ගොස් ඇති අතර කර්මාන්ත ශාලව තුළට පැමිණි පොලිස් නිලධාරීන් මොවුන් ව අල්ලා ගෙන ඇත. මෙම පෙත්සම්කාරිය ඇතුළු අල්ලා ගත් අනෙක් සේවකයන්ට ඉතා ම අසභ්‍ය වචනයෙන් බැන වැදී ඇති පොලිසිය ඔවුන්ට දණ ගැසීමට නියෝග කර ඇත. පසු ව ඔවුන්ට යකඩ පොලුවලින් පහර දී ඇත. පසු ව පෙත්සම්කාරිය ඇතුළු පිරිසට කර්මාන්ත ශාලාවෙන් පිටව යාමට නියෝග කර ඇති පොලිස් නිලධාරීන් ඔවුන් එසේ පිටව යද්දී ඔවුන්ගේ සිරුරේ පිටුපසට බැටන් පොලුවලින් පහර දී ඇත. පසු ව සේවිකාවන් කාන්තා පොලිස් කොස්තාපල්වරියන්ට භාර දී ඇති අතර ඔවුන් ද මෙම පෙත්සම්කාරිය හා තවත් සේවිකාවන්ට පහර දෙමින් කටුනායක පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් ඇත. එහි දී මෙම කාන්තා පොලිස් කොස්තාපල්වරියන් ද පෙත්සම්කාරිය ඇතුළු සේවිකාවන්ට අසභ්‍ය වචනයෙන් බැන වැදී ඇත. කටුනායක පොලිස් ස්ථානයේ දී ඔවුන්ට බංකුවක හෝ වාඩි වීමට ඉඩ නොදී ඇති පොලිසිය බිම වාඩි වීමට කටයුතු සලස්වා ඇත. පෙත්සම්කාරිය හා අනෙක් පිරිස ඉතා කුඩා කාමරයකට දමා අගුළු දමන ලද පොලිස් නිලධාරීන් එම කාමරයට කාන්තාවන් 60ක් පමණ ඇතුල් කර ඇත. මේ හේතුවෙන් හුස්ම ගැනීමේ අපහසුතා පවා සේවිකාවන්ට ඇති වී ඇත. තුවාල ලැබූ පෙත්සම්කාරිය ද ඇතුළු සේවිකාවන් පසු ව බස් රථයකින් මීගමුව රෝහල වෙත රැගෙන ගොස් ඇත.

271/2011 මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරු වූයේ නිශ්ශංක වනිගසේකර යන අය යි. ඔහු රාජකාරිමය කටයුත්තක් සඳහා ත්‍රී රෝද රථයෙන් එහි රියදුරු ජයතිස්ස හා තවත් සේවකයෙක් සමඟ ගොස් නැවත පැමිණෙද්දී මෙම පොලිස් ප්‍රහාරය ආරම්භ වී තිබුණි. ඒ අනුව රියදුරු විසින් ත්‍රී රෝද රථය පාරේ පසෙකට කර නවතා දැමූ නමුත් පොලිස් නිලධාරීන් 30ක් පමණ මෙම ත්‍රී රෝද රථයට පහර දී ඔවුන් ව ද එළියට ඇද දමා ඔවුන්ට දරුණු ලෙස පහර දී ඇත. මෙම පහර දීම් නිසා පෙත්සම්කරුට අවස්ථා කිහිපයක දී සිහිමුර්ජා වී ඇත. ඉන් පසු පෙත්සම්කරු ව කටුනායක පොලිස් ස්ථානයට ඇද ගෙන ගොස් ඇති අතර තවත් තුවාල ලැබූ සේවකයන් 50ක් පමණ රඳවා සිටි සිර මැදිරියකට පෙත්සම්කරු ව ද ඇතුල් කර ඇත. පෙත්සම්කරුගේ ලේ වහනය වෙමින් තිබී ඇති අතර ඔහුට වමනය ද සිදු වෙමින් තිබුණි. තවත් එහි සිටි සේවකයන් වේදනාවෙන් කෑ ගසමින් සිටිය ද පොලිසිය විසින් කිසිදු සහයක් නොදක්වන ලදී. පසු ව පෙත්සම්කරු ව බස් රථයකට දමා මීගමුව මූලික රෝහල වෙත රැගෙන ගොස් ඇත.

272/11 මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරු වූයේ ජයතිස්ස රාජකරුණා යන අය යි. ඔහු ඉහත සඳහන් කළ සිද්ධියේ ත්‍රී රෝද රථය පැදවූ පුද්ගලයා යි. ඉහත කී පරිදි ඔහුගේ ත්‍රී රෝද රථයට පොලිසිය විසින් පහර දී අලාභහානි සිදු කර ඇති අතර එමෙන් ම ඔහුට ද දරුණු ලෙස පහර දී කටුනායක පොලිස් ස්ථානයට රැගෙන ගොස් සිර මැදිරියකට ඇතුල් කර ඇත. පසු ව ඔහු ව ද අනෙක් තුවාලකරුවන් සමඟ බස් රථයකින් මීගමුව රෝහල වෙත රැගෙන ගොස් ඇත.

273/2011 මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරු වූයේ රන්ජන් ලසන්ත පෙරේරා යන අය යි. විරෝධතාවයට පොලිස් ප්‍රහාරය එල්ලවද්දී මෙම පෙත්සම්කරු ද කර්මාන්ත ශාලාවක් තුළට ඇතුල් වී ඇති අතර පොලිසිය එම කර්මාන්ත ශාලාවට කඩා පැන එහි සිටි සේවකයන්ට පහර දී ඇත. එම කර්මාන්ත ශාලාවේ දී ද වෙඩි තැබීම් සිදු කර ඇත. එම වෙඩි තැබීම්වලින් පළා යන සේවකයන් තුවාල ලබා ඇති අතර කර්මාන්ත ශාලාවේ දේපළවලට ද හානි සිදු වී ඇත. මෙම පෙත්සම්කරු ආපනශාලාව ප්‍රදේශයට දිව යද්දී පොලිස් නිලධාරීන්ට අසු වී ඇති අතර බැටන් පොලුවලින් හා ලීවලින් මොහුට පහර දී ඇත.

මෙහු බිම ඇද වැටුණු පසු ව ද පහර දී ඇත. පසු ව කටුනායක පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් සිර මැදිරියකට ඇතුල් කර ඉන් පසු මීගමුව මූලික රෝහලට බස් රථයකින් රැගෙන ගොස් ඇත.

274/2011 මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරු වූයේ ලලින්ද හේරත් යන අය යි. මෙම පෙත්සම්කරු විරෝධතාවයට සම්බන්ධ නොවූ අයෙක් වූ අතර ඔහු කර්මාන්ත ශාලාවේ රැඳී සිට ඇත. බලහත්කාරයෙන් ආරක්ෂක නිලධාරීන්ට ද පහර දෙමින් කර්මාන්ත ශාලාවට ඇතුල් වූ පොලිස් නිලධාරීන් පෙත්සම්කරුට හා අනෙකුත් සේවකයන්ට පහර දී ඇත. පොලිස් පහර දීමෙන් බේරීමට කැපුම් අංශයේ මුද්‍රණ කාමරය තුළට දිව ගිය ද එහි වීදුරු කඩා පොලිස් නිලධාරීන් පෙත්සම්කරුට හා තවත් සේවකයන්ට පහර දෙන ලදී. පෙත්සම්කරුගේ ඇස්වලට හිසට හා උදරය ප්‍රදේශයට පහර දුන් පොලිසිය පෙත්සම්කරු ඇතුළු අනෙක් පිරිස කටුනායක පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් ඇත. ඉන් පසු ඔවුන් ව සිර මැදිරියක රඳවා තබා පසු ව මීගමුව රෝහල වෙත රැගෙන ගොස් ඇත.

346/2011 මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරු වූයේ ප්‍රදීප් කුමාර ප්‍රියදර්ශන යන අය යි. විරෝධතාවයට පොලිස් ප්‍රහාරය එල්ල වූ පසු මොහු ද කර්මාන්ත ශාලාවක් තුළට දිව ගොස් ඇති අතර පොලිසිය එම කර්මාන්ත ශාලාව තුළට ද දොරවල් කඩා වීදුරු කඩා ඇතුල් වී ඇත. ඉන් පසු පෙත්සම්කරු ඇතුළු සේවකයන්ට පහර දී ඇත. කඳුළු ගෑස් ප්‍රහාර ද පොලිසිය විසින් කර්මාන්ත ශාලාව තුළ දී ද එල්ල කර ඇත. පෙත්සම්කරු ද, ගැබිණි කාන්තාවන් ද ඇතුළු සේවකයන්ට පහර දුන් පොලිසිය ඔවුන්ට කර්මාන්ත ශාලා පරිශ්‍රයේ බිම වාඩි වීමට අණ කර ඇත. පසු ව කටුනායක පොලිස් ස්ථානය වෙත ඔවුන් ව බස් රථයකින් රැගෙන ගොස් ඇත. ඔවුන්ගේ තොරතුරු සටහන් කරගත් පොලිස් කොස්තාපල්වරිය ද ඔවුන්ට අසභ්‍ය වචනයෙන් බැන වැදී ඇත. යුද හමුදාවේ ඉහළ නිලයක් දරන්නකු යැයි පෙනී ගිය හා ප්‍රාදේශීය දේශපාලකයෙක් යැයි පෙනී ගිය අයෙක් පවසා සිටියේ රජය විසින් මෙම පනත් කෙටුම්පත සම්මත කිරීම නතර කළ බවත්, එය විරෝධතාකරුවන්ට පවසන ලෙසත් මොවුනට කියා සිට ඇත. මොවුන් බස් රථයේ රියදුරුට කරන ලද ඉල්ලීම අනුව රියදුරු විසින් වේදනාවෙන්

කෑ ගසන සේවකයන් විජය කුමාරතුංග රෝහලට රැගෙන ගොස් ඇත. පෙත්සම්කරුගේ හා තවත් අයගේ තුවාල දරුණු වූ බැවින් වහා ම ඔවුන් රාගම ශික්ෂණ රෝහලට මාරු කර යවා ඇත.

347/2011 මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරු වූයේ නලීන් සංජය ජයතිලක යන අය යි. මොහු ද මෙම විරෝධතාවයට සම්බන්ධ නොවූ සේවකයකු වූ අතර ඔහු නොරාටල් ලංකා කර්මාන්ත ශාලාවේ ප්‍රථමාධාර කාමරයට යන අතර පොලිස් නිලධාරියකු විසින් අත්අඩංගුවට ගෙන ඇත. මෙම විරෝධතාවයට සම්බන්ධ නොවූ බවට ඔහුට කරුණු පැහැදිලි කළ පසු එම පොලිස් නිලධාරියා විසින් මොහු ව මුදා හැරීමට කටයුතු කර ඇත. නමුත් අසළ සිටි පොලිස් නිලධාරීන් ඔහුට යාමට ඉඩ නොදී පහර දී ඇත. ඉන් පසු ඉහත කී කර්මාන්ත ශාලාවේ ඉදිරි පසට ගෙන ගොස් අනෙක් සේවකයන් සමඟ බිම වාඩි කර ඇත. මෙහි දී අවස්ථා කීපයක් පොලිස් නිලධාරීන් විසින් පෙත්සම්කරුට පහර දී ඇත. මෙම පෙත්සම්කරු හා තවත් සේවකයන් 10ක් පමණ දරුණු ලෙස තුවාල ලබා සිටි බැවින් එම කර්මාන්ත ශාලාවට අයත් වාහනයකින් රෝහල වෙත රැගෙන යාමට පොලිසිය කටයුතු කර ඇති අතර එම වාහනය පසු ව පොලිසිය විසින් නතර කර රෝහලට යාමට ඉඩ නොදී කටුනායක පොලිස් ස්ථානයට යාමට අණ කර ඇත. පෙත්සම්කරු ඇතුළු සේවකයන් දරුණු ලෙස තුවාල ලබා සිටියදීත් කටුනායක පොලිස් ස්ථානයට ගෙන ගොස් ප්‍රකාශ සටහන් කරගෙන පසු ව මීගමුව රෝහලට ඇතුළත් කර ඇත. මේ වන විට මීගමුව රෝහල අධික ලෙස රෝගීන්ගෙන් පිරී තිබීම හේතු කොට ගෙන පෙත්සම්කරුගේ අකමැත්ත තිබිය දී පෙත්සම්කරු ව රෝහලෙන් මුදා හැර ඇත. කිසිදු ලේඛනයක් හෝ රෝහලෙන් ලබා දී නැත. ඉන් පසු මෙම පෙත්සම්කරු මහනුවර ශික්ෂණ රෝහල වෙත ඇතුල් වීමට ගිය ද ඔහුට කිසිදු මුදාහැරීමේ ලේඛනයක් හෝ වෛද්‍ය වාර්තාවක් නොමැති නිසා රෝහලට ඇතුල් කරවා ගැනීම මහනුවර ශික්ෂණ රෝහලේ බලධාරීන් විසින් ප්‍රතික්ෂේප කර ඇත. පසු ව පෙත්සම්කරු මහනුවර පෞද්ගලික රෝහලකට ඇතුල් වී ඇත.

348/2011 මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරු වූයේ සමීර සඳරුවන් හෙට්ටිආරච්චි යන අය යි. මෙම පෙත්සම්කරු ද

විරෝධතාවයකට සම්බන්ධ නොවූ අයෙක් වන අතර ඔහු සේවයට වාර්තා කර ඇත්තේ ප.ව. 1.30ට පමණ වන අතර ඔහු වෙළඳ කලාපයට ඇතුල් වන විටත් සේවකයන් තුවාල ලබා සිටිනු දැක ඇත. පොලිසිය ප්‍රහාර එල්ල කරද්දී විරෝධතාකරුවන් ඔහු ගමන් කරන දෙසට පැමිණෙනු දැක ඔහු ද නොරාටල් ඉන්ටර්නැෂනල් කර්මාන්ත ශාලාව තුළට දිව ගොස් ඇත. පොලිසිය මෙම කර්මාන්ත ශාලාව වටකර දොර කඩා බලහත්කාරයෙන් ඇතුල් වී පෙත්සම්කරු ද ඇතුළු සේවකයන්ට පහර දී ඇත. පෙත්සම්කරුගේ හිසේ පිටුපසට පහර දීම හේතුවෙන් ඔහු සිහි නැතිව ඇද වැටී ඇත. පසුව පෙත්සම්කරුව කටුනායක පොලිස් ස්ථානයට ගෙන ගොස් පසු ව මීගමුව රෝහලට ගෙන ගොස් ඇත.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව සේවකයන්ගේ කඩ වී ඇති මූලික අයිතිවාසිකම්

ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉහත කී මූලික අයිතිවාසිකම්වල තීන්දු ව ලබා දෙමින් තීරණය කර ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (ආ) ව්‍යවස්ථාව මගින් සහතික වී ඇති සාමකාමී ව රැස්වීමේ නිදහස, 11වන ව්‍යවස්ථාව මගින් සහතික වී ඇති වධහිංසාවෙන් හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලින් හා දඬුවම්වලින් වැළකී සිටීමේ නිදහස, 13 (1) ව්‍යවස්ථාවෙන් සහතික වී ඇති අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්වලින් වැළකී සිටීමේ නිදහස හා 12 (1) ව්‍යවස්ථාවෙන් සහතික වී ඇති නීතිය පසිඳලීම හා ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණවීමේ අයිතිවාසිකම යන මූලික අයිතිවාසිකම් මෙම පෙත්සම්කරුවන්ගේ උල්ලංඝනය වී ඇති බවයි.

## සාමකාමීව රැස්වීමේ නිදහස උල්ලංඝනය වීම

සාමකාමීව රැස්වීමේ නිදහස ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (ආ) ව්‍යවස්ථාව මගින් සහතික වී ඇති මූලික අයිතිවාසිකමකි. විරෝධතාවකට රැස්වීමේ අයිතිය පුරවැසියන්ට මින් හිමිවේ. නමුත් මෙම අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේ එකී විරෝධතාවය හෝ රැස්වීම සාමකාමී නම් පමණි.

මෙහි දී ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානය යොමු වන්නේ ***Christians against Racism and Fascism V. United Kingdom*** (No. 8440/78, Commision decision of 16 July 1980, Decisions and Reports (DR) 21,p.138) හි දී යුරෝපා කොමිසමේ තීන්දුව කෙරෙහි ය. එකී තීන්දුවට අනුව රැස්වීමක සංවිධායකයන් මහජන කැළඹීමක් ඇති වන ආකාරයකට ප්‍රචණ්ඩකාරීත්වයක් ඇති කිරීමට අරමුණු නොකළේ නම් එම විරෝධතාවය සාමකාමී යැයි සැලකිය හැක. එනම් වෙනත් කණ්ඩායමක හෝ වෙනත් සාධක හේතු කොට ගෙන ඇති වන ප්‍රචණ්ඩත්වයට වඩා සැලකිය යුත්තේ සාමකාමී රැස්වීමක් පැවැත්වීමට අරමුණක් තිබුණා ද නැද්ද යන්න බව යි. සංවිධායකයන්ගේ ද සහභාගිවන්නන්ගේ ද කිසිදු අරමුණක් නොමැති ව තිබිය දී ආගන්තුක ව පැමිණෙන ප්‍රචණ්ඩත්වයක් හේතු කොට ගෙන රැස්වීමේ හා සමාගමයේ නිදහසට ඇති රැකවරණය ඉවත් නොවන බව එකී යුරෝපා කොමිසමේ තීරණයේ දක්වා ඇති බව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි.

***බණ්ඩාර හා තවත් අය එ. ජාගොඩ ආරච්චි, ස්ථානාධිපති, පොලිස් ස්ථානය කොටුව හා තවත් අය*** (2000) 1 ශ්‍රී ලංකා නීති වාර්තා, 225 යන ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය කෙරෙහි ද මෙහි දී අවධානය යොමු කරයි. රැස්වීමේ සාමාන්‍ය හැසිරීමට අනුව මහජන සාමය කඩවන බවට සාධාරණ ලෙස වැටහී යන්නේ නම් එකී රැස්වීම සාමකාමී වීමේ රේඛාව ඉක්මවා යන බවත් එවන් තත්ත්වයක දී මෙම 14(1) (ආ) ව්‍යවස්ථාවේ රැකවරණය ලැබීමේ අවස්ථාව වැළකෙන බවත් එහි දී ගරු ශ්‍රෙෂ්ඨාධිකරණය දක්වා ඇත. තවදුරටත් එකී ශ්‍රෙෂ්ඨාධිකරණ තීරණයේ දැක්වෙන්නේ රැස්වීමේ සංවිධායකයන් ප්‍රචණ්ඩත්වයක් ඇති වීම අපේක්ෂා නොකළ ද පසු ව රැස්වීමට සහභාගිවන්නන් මහජන සාමය කඩවන ආකාරයට කටයුතු කිරීමට යොමු වන්නේ නම් එවැනි අවස්ථාවක 14 (1)(ආ) ව්‍යවස්ථාවෙන් හිමි සාමකාමී රැස්වීමේ නිදහස සම්පූර්ණයෙන් භුක්ති විඳීමේ අවස්ථාව අහිමි වන බව යි. එවැන්නක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 (7) ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි නීතියෙන් නියම කරනු ලැබූ නියමයන්ට යටත් ව හා මහජන සාමය ආරක්ෂා කිරීමේ අරමුණින් වැළැක්වීමට අවස්ථාවක් හිමි වන බව යි.

මෙම සිදුවීම මගින් මහජන සාමයට බලපෑමක් වූවා ද සලකා බැලීම අතිශයින් වැදගත් බව පවසන ශ්‍රේෂ්ඨාධිකරණය එහි දී මහජන

සාමයට (Public Order) බලපෑම් වීම හා නීතිය හා සාමයට (Law and Order) විරුද්ධ වීම යන්නෙහි වෙනස වටහා ගැනීම වැදගත් බව පවසයි. ඒ සඳහා ***Ashok Kumar V. Delhi Administration and Others*** 1982 AIR 1143, 1982SCR (3) 707 යන ඉන්දියානු නඩු තීන්දුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය මගින් සැලකිල්ලට භාජනය කරනු ලබයි. එකී නඩු තීන්දුවේ දී දක්වන්නේ සමාන ක්‍රියාවන් විවිධ සංදර්භයන් තුළ සිදු විය හැකි අතර ඒ අනුව ප්‍රතික්‍රියාවන් විවිධ විය හැකි බව යි. එක අවස්ථාවක දී ක්‍රියාවක් විශේෂිත පුද්ගලයන් කෙරෙහි පමණක් බලපෑ හැකි අතර එවිට එය නීතිය පිළිබඳ ප්‍රශ්නයක් විය හැක. තවත් අවස්ථාවක කරන ක්‍රියාවක් මහජන සාමයට බලපෑම් ඇති කරනු ඇත. ක්‍රියාවේ විභවතාවය මගින් ප්‍රජාවේ ජීවිතයේ සාමාන්‍ය පැවැත්ම බාධාවට ලක් කරයි නම් එය මහජන සාමය පවත්වා ගෙන යාමට අගතිගාමී ලෙස බලපාන ක්‍රියාවක් ලෙස සලකයි. මහජන සාමය පවත්වාගෙන යාම තුළින් අපේක්ෂා කරන්නේ මහජනයාගේ දිනපතා සාමාන්‍ය ක්‍රියාවන් අසාමාන්‍ය ලෙස බාධාවලින් තොර ව පවත්වා ගෙන යාමට අවශ්‍ය වටපිටාව සැකසීම යි. මහජන සාමයට බාධා කරන ක්‍රියාවක් ලෙස සලකන්නේ එකී ක්‍රියාවට මහජනයාගේ දිනපතා කටයුතුවලට බාධා කිරීමට හැකියාවක් ඇත්නම් පමණක් බව මෙම ඉන්දියානු නඩු තීන්දුව ඇසුරෙන් ශ්‍රේෂ්ඨාධිකරණය දක්වයි.

මේ අනුව නිදහස් වෙළඳ කලාපයේ සේවක අරගලය පිළිබඳ ව විග්‍රහ කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය දක්වන්නේ නිදහස් වෙළඳ කලාපය ආයෝජන මණ්ඩලය මගින් පාලනය වන කලාපයක් බවත් එහි සියලු දොරටුවල ආයෝජන මණ්ඩලයේ ආරක්ෂක නිලධාරීන් රැඳී සිටිමින් ආරක්ෂාව සලසන බවත් නිදහස් වෙළඳ කලාපය තුළට ඇතුල් විය හැක්කේ ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ඇති පුද්ගලයන්ට පමණක් බවත් ය. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙන්නේ මෙම නිදහස් වෙළඳ කලාපයේ සේවක විරෝධතාවය නිදහස් වෙළඳ කලාපය තුළ දී ඇති වූ එකක් බවත් පොදු මහජනයා කලාපය තුළ කටයුතුවලට සම්බන්ධ නොවන බැවින් මෙම විරෝධතාවය මගින් බාධාවක් වී ඇත්තේ කලාපය තුළ කර්මාන්ත ශාලාවල කටයුතුවලට විනා පොදු මහජනයාට නොවන බවත් ඒ අනුව මහජන සාමය කඩ වන තත්ත්වයක් නිර්මාණය වී නොමැති බවත් පෙන්වා දෙයි.

සේවකයන් විසින් කටුනායක පොලිස් ස්ථානයට පහර දුන්නා ය, යන චෝදනාව සම්බන්ධයෙන් ද ගරු ශ්‍රේෂ්ඨාධිකරණය මෙහි දී සලකා බලයි. ඒ සම්බන්ධයෙන් තොරතුරු ඔවුන් ලබා ගන්නේ මහානාම තිලකරත්න ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාවෙනි. මෙම සිදුවීම පිළිබඳ ස්ථානීය පරීක්ෂණයක් පැවැත්වීම මගින් ද සේවකයන්ගෙන් හා පොලිස් නිලධාරීන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගැනීම මගින් ද මහානාම තිලකරත්න ජනාධිපති පරීක්ෂණ කමිටුව ඉතා නිරවද්‍ය පුළුල් පරීක්ෂණයක් සිදු කර තිබුණි. එකී පරීක්ෂණ කමිටු වාර්තාවේ පොලිස් ස්ථානයට විරෝධතාකරුවන් පහර දීමට අදාළ කොටසට අවධානය යොමු කරන ශ්‍රේෂ්ඨාධිකරණය පවසන්නේ විරෝධතාකරුවන් පොලිසියේ දේපළවලට දැඩි ලෙස අලාභ හානි සිදු කරන ලද බවට චෝදනා කළ ද එය පැවති තත්ත්වයන් යටතේ පිළිගත නොහැකි බව යි. විරෝධතාකරුවන් සිටි නිදහස් වෙළඳ කලාපයේ දොරටු අංක 04 සිට කටුනායක පොලිස් ස්ථානය ඇත්තේ බොහෝ දුරින් බවත් එමෙන් ම කටුනායක පොලිසියේ ගොඩනැගිලි ගස්වලින් ද ආවරණය වී ඇති බවත් එම නිසා ගල් ප්‍රහාර මගින් චෝදනා කරනු ලබන ආකාරයේ දරුණු හානියක් කිරීමට හැකියාවක් නැති බවට ජනාධිපති පරීක්ෂණ කමිටුවේ ඇති කරුණ ශ්‍රේෂ්ඨාධිකරණය ද පෙන්වා දෙයි. තවදුරටත් කමිටු වාර්තාවේ කරුණු ශ්‍රේෂ්ඨාධිකරණය උපුටා දක්වයි. විරෝධතාකරුවන් පොලිස් ස්ථානය තුළට ඇතුළු වුව ද ඒ වන විටත් එම පොලිස් ස්ථානයේ 500ක් පමණ පොලිස් නිලධාරීන් ද 16ක් ඉහළ නිලධාරීන් ද සිටි බැවින් මෙම තත්ත්වය පාලනය කර ගැනීමට පොලිසියට හැකියාවක් තිබූ බවත් යන කරුණ ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි.

එමෙන් ම ශ්‍රේෂ්ඨාධිකරණය තවදුරටත් දක්වන්නේ මේ තත්ත්වය තුළත් විරෝධතාකරුවන් උද්ඝෝෂණය කළේ නිදහස් වෙළඳ කාලාපය තුළ බැවින් ඔවුන්ගෙන් මහජනයාගේ එදිනෙදා ජීවිතයට හානියක් නොවූ බැවින් ද පොලිසිය විරෝධතාව මැඩ පැවැත්වීමට කටයුතු කළ ආකාරය ඉතාම රළු බව යි. ජීව උණ්ඩ ද, අවි ආයුධ ද, යකඩ පොලු ද, ඇණ ගැසූ පොලු ද යොදා ගෙන සේවකයන්ට පහරදෙමින් මෙම විරෝධතාවය වැළැක්වීමට කටයුතු කිරීමට තරම් උත්සන්න වූ විරෝධතාවයක් නොතිබුණු බවත් කෙසේ වෙතත් මහජන සාමය කඩවන උද්ඝෝෂණයකට පවා මේ මට්ටමින් ක්‍රියාත්මක වීමට පොලිසියට

**හැකියාවක් නොමැති බවත් ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙමින් තිරණය කරන්නේ මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1)(ආ) ව්‍යවස්ථාවේ දැක්වෙන අනුමත කළ හැකි මැඩපැවැත්වීමක් නොවන බව යි.**

අපරාධ නඩු විධාන සංග්‍රහයේ නීති විරෝධී රැස්වීම්වලට එරෙහි ව ක්‍රියාත්මක විය යුතු ආකාරය දක්වන 95 වගන්තිය කෙරෙහි ද ශ්‍රේෂ්ඨාධිකරණය අවධානය යොමු කරයි. රැස්වීමක් විසුරුවා හැරීම සඳහා පොලිසිය නීත්‍යනුකූලව බලය යෙදිය යුත්තේ එය සාධාරණ ව අවශ්‍ය නම් (Reasonably necessary) පමණක් බවට මෙම 95 වගන්තියේ (2) උප වගන්තියේ විශේෂ කොට සඳහන් කර ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය දක්වයි.

වැඩිදුරටත් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය පොලිසියේ දෙපාර්තමේන්තු නියෝග කෙරෙහි ද අවධානය යොමු කරයි. පොලිස් දෙපාර්තමේන්තු නියෝග A 19 හි B (4) යටතේ පැහැදිලිව දක්වන්නේ පොලිස් වෙඩි තැබීම් නියෝගවල අඩංගු කිසියම් වරදක් අදාළ පිරිස විසින් කරන්නේ නම් හෝ කිරීමට උත්සහ දරන්නේ නම් මිස කිසිදු තත්ත්වයක් යටතේ වෙඩි තැබීම සිදු නොකළ යුතු බව යි. මෙම සිදුවීමේ දී උද්ඝෝෂකයන් එවැනි වරදක් සිදු කර හෝ සිදු කිරීමට උත්සහ දරා නොමැති බව පෙන්වා දෙන ශ්‍රේෂ්ඨාධිකරණය විශේෂයෙන් සඳහන් කරන්නේ ඒ අනුව පොලිසිය විසින් උද්ඝෝෂකයන්ට වෙඩි තැබීම කිසි ලෙසකින්වත් සාධාරණීකරනය කළ නොහැකි බව යි.

මෙම නඩුවේ වගඋත්තරකාර පොලිස් නිලධාරීන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු දක්වා ඇත්තේ මෙම වෙඩි තැබීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 (8) ව්‍යවස්ථාවෙන් පොලිස් නිලධාරීන්ට හා හමුදා නිලධාරීන්ට ලබා දී ඇති පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ක්‍රියාවේ යෙදවීමක් බව යි. නමුත් මෙම සිදුවීමේ දී විරෝධතාකරුවන් පොලිසියට පහර දීමක් සිදු කළ ද අසාමාන්‍ය වෙඩි තැබීමක් සිදු කර ඇත්තේ විරෝධතාකරුවන් විසිර යාම ආරම්භ වූ පසු බවට පැහැදිලිව පෙනී යන බවත් එමෙන් ම තුවාල ලැබූ පුද්ගලයන්ගේ තුවාලවලින් පෙනී යන්නේ උණ්ඩ විශාල ප්‍රමාණයක් එල්ල කර ඇත්තේ දණහිසට ඉහළින් බවත් ශ්‍රේෂ්ඨාධිකරණය දක්වයි.

මෙම සේවක විරෝධතාවය නීතිවිරෝධී බව තහවුරු කිරීමට වගඋත්තරකාර පොලිස් නිලධාරීන් ඉදිරිපත් කරන තවත් කරුණක් නම් පොලිස් ආඥා පනතේ 77 වගන්තිය ප්‍රකාර ව මෙවන් පෙළපාලියක් පිළිබඳ දැන්වීම සිදු කිරීම අවශ්‍ය වුවත් එවැන්නක් සිදු නොවීම මගින් මෙය පොලිස් ආඥා පනතේ 77 වගන්තියට අනුකූල නොවන විරෝධතාවයක් බව යි. වර්ෂ 1865 අංක 16 දරණ පොලිස් ආඥා පනතේ 77 වගන්තිය අනුව යම් පෙළපාලියක් පැවැත්වෙන්නේ නම් එය ආරම්භවීමට අඩු ම තරමේ පැය 6කට වත් පෙර ළඟ ම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට දැනුම් දිය යුතු බවට දැක්වෙන බව ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි. නමුත් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය මෙහි දී පෙන්වා දෙන්නේ 77 වගන්තියේ පැහැදිලි ව දැක්වෙන්නේ එවැනි දැන්වීමක් අවශ්‍ය වන්නේ පෙළපාලි (Procession) සඳහා බව යි. මෙය එවැන්නක් ද යන ප්‍රශ්නය ශ්‍රේෂ්ඨාධිකරණය මෙහි දී මතු කරයි. මෙම පැය 6 නිවේදනය ලබා දීමක් මගින් උපකල්පනය වන්නේ එය එක්වර පැන නැගුණු දෙයක් නොව සංවිධානය කරන ලද දෙයක් බව යි. මෙම සිදුවීමේ දී එය එක්වර ම පැන නැගුණක් ද එසේත් නැත්නම් සංවිධානය කරන ලද්දක්ද යන්න පිළිබඳ තහවුරු කිරීමට සාක්ෂි ප්‍රමාණවත් නොවන බවත් ශ්‍රේෂ්ඨාධිකරණය දක්වයි. පෙත්සම්කාර සේවකයන්ට අනුව මෙය එක්වර ම පැන නැගුණ සිදු වීමකි.

මානව හිමිකම් පිළිබඳ යුරෝපා අධිකරණයේ (European Court of Human Rights) විභාග වූ ***Nurettin Aldemir V. Turkey*** (Nos. 32124/02, 32126/02, 32129/02, 32132/02, 32133/02, 32137/02 and 32138/02, 18 December 2007) නඩුවේ තීන්දුව වෙත ද අවධානය යොමු කරන ශ්‍රේෂ්ඨාධිකරණය, එහි දී යෝජිත පනතකට එරෙහි ව පැවැති විරෝධතාවයක් පොලිසිය විසින් බලය යොදා විසුරුවා හැරීම මානව හිමිකම් පිළිබඳ යුරෝපා ප්‍රඥප්තියේ (Europrean Charter of Human Rights) 11වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බවට තීරණය වූ බව පවසමින් මෙම සිදුවීමේ දී ද ඊට සමාන කරුණු ම ඇති බැවින් මෙහි දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (ආ) ව්‍යවස්ථාවේ සඳහන් සාමකාමී ව රැස්වීමේ නිදහස උල්ලංඝනය වී ඇති බව මෙම අධිකරණයේ මතය බව ද දක්වයි. සාමකාමීව රැස්වීමට ඇති අයිතිය හා මහජන සාමය පවත්වාගෙන යාම යන කරුණු දෙක නියමානුකූල ව සමබර ව පවත්වා

ගෙන යාමට මෙම සිදුවීමේ දී පොලිසිය අසමත් වූ බවත් ඒ අනුව 14 (1) (ආ) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවත් ශ්‍රේෂ්ඨාධිකරණය දක්වයි.

***සේනසිංහ එ. කරුණාතිලක, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නුගේගොඩ හා තවත් අය*** (2003)1 SLR නඩු තීන්දුවේ සඳහන් වන පහත කරුණ මෙහි දී ශ්‍රේෂ්ඨාධිකරණය උපුටා දක්වයි. සාමකාමී ව රැස්වීමේ නිදහස හා භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස සකසා ඇත්තේ ද සාමය හා පාලනය පවත්වා ගෙන යාම සඳහා ය. වෙනත් අයුරකින් කියන්නේ නම් ඒ මගින් විරෝධතා දැක්වීමේ නිදහස සුරක්ෂිත වෙයි. ඒ මගින් මහජනයාගේ කරුණු පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩා පොහොසත් වෙයි. විරෝධතාවය මැඩ පැවැත්වීමෙන් එකී තීරණ ගැනීමේ ක්‍රියාවලිය යම් වංක භාවයකට පත්වීමේ සම්භාවිතාවයක් ඇති වන අතර එය අවසානයේ සාමය හා පාලනය අනතුරේ වැටීමට හේතු වනු ඇත.

වධහිංසාව හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලිවලින් හෝ දඬුවම්වලින් වැළකී සිටීමේ අයිතිය උල්ලංඝනය වීම.

විරෝධතාකරුවන්ට පහර දී වධහිංසා කිරීම පිළිබඳ ඉහත කී කරුණු කෙරෙහි නැවතත් මෙහි දී ශ්‍රේෂ්ඨාධිකරණය අවධානය යොමු කරයි. විශේෂයෙන් මහානාම තිලකරත්න ජනාධිපති කමිටු වාර්තාවේ සාක්ෂි සහිත ව දැක්වෙන පොලිසිය මගින් සේවකයන්ට සිදු කළ වධහිංසනයන් අමානුෂික හා අවමන් සහගත සැලකිලි හා පහරදීම් පිළිබඳ ව ශ්‍රේෂ්ඨාධිකරණය අවධානය යොමු කරයි.

නීතිපතිවරයා විසින් මෙම සිදුවීම පිළිබඳ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද රහස්‍ය වාර්තාවක දැක්වුණේ මෙම දිනයේ දී පුද්ගලයන් 8 දෙනෙක් වෙඩි තැබීම්වලින් තුවාල ලබා ඇති බව යි. පොලිසිය මෙම සිදුවීම පාලනය කිරීමේදී සිය බලය ඉක්මවා කටයුතු කර ඇති බවක් මෙන් ම පොලිස් දෙපාර්තමේන්තු නියෝග A 19 උල්ලංඝනය කර ඇති බවත් නැවතත් අවධාරණය කරයි.

**වෙඩි තැබීම් හි බරපතළකම අවධාරණය කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය අංක 265/2011 පෙත්සමේ පෙත්සම්කරුට සිදු වූ ශාරීරික හානි පිළිබඳ ව විශේෂ කොට දක්වයි. මෙම පොලිස් වෙඩි තැබීම්**

**නිසා එකී පෙත්සම්කරුගේ ප්‍රජනන පද්ධතියට සදාකල් පවතින බරපතළ තුවාල සිදු වී ඇති අතර ඔහුගේ ගුද මාර්ගය පූර්ණ ලෙස හානියට පත් වී ඇත. මේ හේතු කොට ගෙන ඔහුට මුත්‍රා හා මළ පිට කිරීමට සිදු වී ඇත්තේ ඉවතලන බෑග්වලට බව ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි.** මෙම වෙඩි තැබීම් නිසා මිය ගිය රොෂාන් චානකගේ වකුගඩුවලට තුවාල සිදු වී තිබීමත් තවත් පෙත්සම්කරුවකුගේ ඇස අසළ තුවාල සිදු වී තිබීමත් නිසා තහවුරු වන්නේ පොලිසිය වෙඩි තබා ඇත්තේ දණහිසෙන් පහළට නොවන බව යැයි ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි. විරෝධතාකරුවන් පොලිස් නිලධාරීන්ට පහර දුන්න ද මේ ආකාරයට පහර දීම පොලිස් දෙපාර්තමේන්තු නියෝග B1 - A19 උල්ලංඝනය කිරීමක් බව ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි.

***අමල් සුදත් සිල්වා එ. කොඩිතුවක්කු*** (1987 2 SLR 119,127) ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව කෙරෙහි අවධානය යොමු කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව පිළිබඳ එකී තීන්දුවේ දී ගරු විනිශ්චයකාරවරුන් ප්‍රකාශ කරන්නේ මෙම අයිතිය කිසිදු සීමා කිරීමකට යටත් නොවන මූලික අයිතිවාසිකමක් බවයි. අපරාධකරුවෙක් ද නැද්ද යන්න නොසලකා ශ්‍රී ලංකාවේ සියලු ම තැනැත්තන්ට මෙම අයිතියේ ආරක්ෂාව ලැබෙන බවත් තවදුරටත් එකී නඩු තීන්දුවේ දී වැඩිදුරටත් දක්වයි.

ඇතැම් වින්දිතයන්ට තුවාල සිදු වී ඇත්තේ ඔවුන්ගේ අත්, මැණික් කටු, ඇඟිලි ආදී ප්‍රදේශවලට බවත් ඒවා සිදු වී ඇත්තේ සේවකයන් පවසන පරිදි පොලිසිය විසින් යකඩ පොලු, ලී පොලු වැනි මොට ආයුධවලින් සිදු කරන ලද පහර දීම් වළකාලීමට කරනු ලැබූ උත්සහයන්වල දී බව පෙනී යන බව ශ්‍රේෂ්ඨාධිකරණය දක්වයි. එමෙන් ම මෙම පහරදීමට සම්බන්ධ වූ පොලිස් නිලධාරීන් සිය අංකය නොමැති නිල ඇඳුම් ඇඳ සිටීමෙන් ම මෙම පහර දීම සැලසුම් කරන ලද්දක් බව පෙනී යන බව ශ්‍රේෂ්ඨාධිකරණය දක්වයි.

''තොපි චණ්ඩිද? තොපි පොලිසියටත් ගහන්න නේද ආවේ? පොලිසියේ තරම දැන්වත් දැනගනිව්'' යනුවෙන් පොලිස් නිලධාරියෙක් පැවසූ බවට ජනාධිපති කමිටුව ඉදිරියේ සාක්ෂි දෙන සේවකයෙක්ගේ

අදහස් වෙත අවධානය යොමු කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය පවසන්නේ මෙය මගින් සේවකයන්ට දඬුවම් කිරීමේ අදහසක් පොලිසියට තිබූ බව පෙනී යන බව යි. ජනාධිපති කමිටු වාර්තාවේ දක්වා ඇති වින්දියන්ගේ සාක්ෂි මගින් මෙම සිදුවීමට පසු ව සම්බන්ධ වන කාන්තා පොලිස් නිලධාරීන්ගේ ද ඇතුළු ව පොලිසියේ නින්දිත හැසිරීම පැහැදිලි ව පෙනීයන බවත් ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි. කර්මාන්තශාලා තුළට පොලිසිය ඇතුළු වීම වැළැක්වීමට උත්සහ කළ ආරක්ෂක නිලධාරීන්ට පහර දීම, කිසිදු අනුකම්පාවකින් තොරව ගර්භනී සේවිකාවන්ට පහර දීම, අසභ්‍ය භාෂාවෙන් ඇමතීම, හෙල්මට්, රන් මාල ඇතුළු සේවකයන්ට අයත් භාණ්ඩ සේවකයන්ගෙන් ඉවත් කර ගැනීම, කර්මාන්තශාලාවල දේපළවලට හානි සිදු කිරීම, හා විරෝධතාවට සම්බන්ධ වූවා ද නැද්ද යන්න නොසලකා කර්මාන්තශාලාවල සිටි සියලු දෙනාට පහරදීම පොලිසිය විසින් කෲර, අමානුෂික හා අවමන් සහගත සැලකිලි සිදු කළ බවට ප්‍රමාණවත් සාක්ෂි බව ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි.

එමෙන් ම තුවාල ලැබූ විරෝධතාකරුවන් රෝහල්වලට ගෙන යාමට ද පොලිසිය බාධා කර ඇති බවත් ප්‍රදේශවාසීන් විසින් තාප්පයක් කඩා තුවාලකරුවන් වෙළඳ කලාපයෙන් පිටතට ගෙන රෝහල් කරා ගෙනයාමට කටයුතු සලස්වා ඇති බවත් එමෙන් ම මෙහි දී පොලිස් වෙඩි තැබීමෙන් මිය ගිය රොෂේන් චානක රෝහලට රැගෙන ආ වාහනයට පොලිසිය විසින් යකඩ පොලුවලින් පහර දීමෙන් එහි ඉදිරිපස වීදුරුව හා පැති වීදුරු කැඩී ඇති බවත් මේ හේතුවෙන් රොෂේන් චානක රෝහල් ගත කිරීම ප්‍රමාද වූ බවත් ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි. මෙහි පෙත්සම්කරුවකු වන එච්. එම්. එම්. සම්පත් කුමාර යන අයගේ වෛද්‍ය නීති වාර්තාවේ (Medico Legal Report) දැක්වෙන්නේ වෙඩි තැබීම සවස 1ත් 1.30ත් අතර කාලයේ දී සිදු වී ඇති වුවත් මීගමුව රෝහලට මොහු ව ඇතුළත් කරන්නේ සැලකිය යුතු ප්‍රමාදයකින් පසු සවස 1.57ට බව යි.

වෛද්‍ය ප්‍රතිකාර ගැනීම වැළැක්වීම කෲර සැලකිල්ලක් බවට ***Thomas V. Jamaica*** (Communication No. 321/1988< UN Doc. CCPR/C/49D321/1988) හි *තීරණය* කළ බවට ***සෝමවර්ධන එ. බන්ධනාගාර අධිකාරී හා තවත්*** (SC App 494/93 Spl SC Minutes 22

March 1995) නඩුවේ උපුටා දක්වා ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි. වෙඩි තැබීම් හා අනෙකුත් තුවාල සහිත පුද්ගලයෙකුට නිසි කළ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම හිතාමතා වැළැක්වීම කෲර, අමානුෂික හා අවමන් සහගත සැලකිල්ලක් බව ශ්‍රේෂ්ඨාධිකරණය දක්වයි.

## අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම

අත්තනෝමතික අත්අඩංගුවට ගැනීමෙන් වැළකීමේ අයිතිය සියලු ම තැනැත්තන්ට ලබා දී ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 ව්‍යවස්ථාවෙන් ය. 13 (1) ව්‍යවස්ථාවේ එය දැක්වෙන්නේ මෙලෙස යි.

''නීතියෙන් නියම කරනු ලැබූ කාර්යපටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේ ය. යම් තැනැත්තකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේය''

මෙම ව්‍යවස්ථාවේ සඳහන් 'අත්අඩංගුවට ගැනීම' යන්න අර්ථනිරූපනය කරන ***වික්‍රමබන්දු එ. හේරත්*** (SC Application 27/88 SC Minutes 6 April 1990) නඩුවේ එකී අර්ථ නිරූපනය උපුටා දැක්වීමට ශ්‍රේෂ්ඨාධිකරණය කටයුතු කරයි. එයට අනුව නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් විසින් සිදුකරන කුමන ආකාරයක හෝ පුද්ගලික නිදහස සීමා කිරීමක් අත්අඩංගුවට ගැනීමක් ලෙස සලකයි.

ඒ අනුව SC FR 268,270,271,272,273,274,346,347 හා 348 පෙත්සම්හි පෙත්සම්කරුවන් පොලිස් පහරදීමෙන් පසු කටුනායක පොලිස් ස්ථානයේ රඳවා තබා ගැනීම අත්අඩංගුවට ගැනීමක් ලෙස සැලකිය හැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරයි. මෙම පෙත්සම්කරුවන්ට ඔවුන්ට විරුද්ධ ව ඇති චෝදනාව කුමක්ද යන්න නිසි පරිදි දැනුම් දීමක් මෙම පෙත්සම්කරුවන්ට සිදු කර නොමැති බව පෙන්වා දෙන ශ්‍රේෂ්ඨාධිකරණය එසේ දැනුම් දීම අපරාධ නඩු විධාන සංග්‍රහයේ 23(1) වගන්තිය යටතේ ද අවශ්‍ය අවශ්‍යතාවයක් බව දක්වයි. ඒ අනුව මෙහි දී මෙම පෙත්සම්කරුවන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 (1) ව්‍යවස්ථාවෙන් හිමි ව ඇති අයිතිය උල්ලංඝනය වී ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය නිගමනය කරයි.

පොලිස් නිලධාරීන් කර්මාන්ත ශාලාවලට පැන පහර දීමේ දී ඔවුන්ගේ පහර දීම්වලින් මිදී පලා යන සේවකයන් රඳවා ගැනීමත් ඔවුන්ට පහරදීමත් පෙත්සම්කරුවන්ගේ මෙන්ම කර්මාන්තශාලාවල සිටි සේවකයන්ගේ පුද්ගලික නිදහස සීමා කිරීමක් බව ශ්‍රේෂ්ඨාධිකරණය දක්වයි.

SC FR 268,270,271,272,273,274,346,347 හා 348 හි පෙත්සම්කරුවන් කටුනායක පොලිස් ස්ථානයේ පොලිස් සිර මැදිරියේ හා අපරාධ අංශයේ කාමරයක රඳවා තබා ගැනීම අත්තනෝමතික රඳවා තබා ගැනීමක් ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය දක්වයි.

## 12 (1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම - සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම

සියලු දෙනා ම නීතිය ඉදිරියේ සමානාත්වය හා සියලු දෙනාට නීතියේ සමාන රැකවරණය ලබා දෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් ය. 12 (1) ව්‍යවස්ථාවේ එය මෙසේ දැක්වෙයි.

'නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය.'

මෙම සිදුවීමේ දී අත්තනෝමතික ලෙස බලය භාවිතා කිරීම මගින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ලෙස මෙම විරෝධතාකරුවන්ට ඉහත කී 12 (1) ව්‍යවස්ථාවෙන් හිමි වූ නීතිය ඉදිරියේ සමානත්මතාවය හා නීතියේ සමාන රැකවරණය ලැබීමේ අයිතිය උල්ලංඝනය වූ බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරයි.

***සංසදාස සිල්වා එ. අනුරුද්ධ රත්වත්තේ*** (1998 1 SLR 250 පිටුව) නඩුවේ තීන්දුවේ දී, රාජ්‍යයට, රාජ්‍ය නිලධාරීන්ට හා රාජ්‍ය අධිකාරීන්ට පවරා ඇති බලය පරමාධිකාරී හා අසීමාන්තික නොවන බවටත්, එම බලය මහජන විශ්වාසය තුළ පවතින බවත්, එම බලය භාවිත කළ යුත්තේ මහජන යහපත සඳහා මිස නුසුදුසු අරමුණු වෙනුවෙන් නොවන බවත් මේ වන විට හොඳින් ස්ථාවර වී ඇති නීතිය බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිදු කරන ලද අර්ථ දැක්වීම මෙම නඩුවේ දී ද උපුටා දක්වයි.

නීතිය හා සාමය පවත්වාගෙන යාමට පොලිසියට බලය පවරා ඇතත් ඔවුන්ට කිසිවිටකත් ඉහත කී සමානාත්මතාවයේ අයිතිය නොසලකා කටයුතු කිරීමේ හැකියාවක් නොමැති බව ශ්‍රේෂ්ඨාධිකරණය මෙහි දී පෙන්වා දෙයි. මෙම සිදුවීමේ දී සේවකයන් විරෝධතාවට සම්බන්ධ වීම හා නීතිවිරෝධී ක්‍රියාවන් සිදු කිරීම යන්න ඇත්ත වශයෙන් ම සිදු වුවත් ඔවුන්ට නීතිය ඉදිරියේ සමාන ආරක්ෂණය හිමිවිය යුතු බව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය මෙහි දී පෙන්වා දේ.

## මෙම සිදුවීමේ දී ඉහළ පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වය හා රාජ්‍යයේ වගකීම

මෙම සිදුවීමේ දී පොලිසියේ ඉහළ නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ වෙන ම මාතෘකාවක් යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය කරුණු දක්වයි. ඔවුන් ඒ සඳහා උපයෝගී කර ගන්නේ මෙම සිදුවීම සම්බන්ධ ව ඉහත විස්තර කරන ලද මහානාම තිලකරත්න ජනාධිපති පරීක්ෂණ කමිටු වාර්තාව යි. පොලිස්පතිවරයා ඇතුළු පොලිසියේ ඉහළ නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව ජනාධිපති පරීක්ෂණ කමිටුව දක්වා ඇති අදහස් 'මෙහි පොලිසියේ මර්දනකාරී ක්‍රියාකාරීත්වය' යන පරිච්ඡේදය යටතේ ද සාකච්ඡා කර ඇත.

**රාජ්‍යය මූලික අයිතිවාසිකම්වල ආරක්ෂකයා වන බවත් එම නිසා මෙවැනි යම් කැරලිකාරී අවස්ථාවක් එළඹෙන විට මනුෂ්‍ය ජීවිතවලට හා දේපළට අවම හානියක් වන පරිදි එය සමනය කිරීමට සියලු පූර්ව ආරක්ෂක විධිවිධානයන් යෙදීමට රජයට වගකීමක් ඇති බවත් ශ්‍රේෂ්ඨාධිකරණය මෙහි දී අවධාරණය කරයි.** මෙය ඉතා ම වැදගත් ප්‍රකාශයකි.

මෙහි දී ඉහළ පොලිස් නිලධාරීන් කිසිදු දුර දැකීමකින් තොර ව හා ක්‍රියාශීලීභාවයකින් තොර ව කටයුතු කර ඇති බව පෙනී යන බවත් ජීව උණ්ඩ යොදා වෙඩි තැබීම මෙහි දී අනවශ්‍ය බවත් එය අවසාන ප්‍රතිකර්මයක් ලෙස භාවිත කළ යුතු එකක් බවත් ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දේ. වෙනත් මෙවැනි විරෝධතා අවස්ථාවල දී ඒවා සමනය කිරීමට සිදු කරන ක්‍රියා මෙහි දී ජීව උණ්ඩ යොදා වෙඩි තැබීමට ප්‍රථම

ව සිදු කර නොමැති බවත් උදාහරණයක් ලෙස ජල ප්‍රහාරක රථ සූදානම් කර තිබුණි නම් පොලිස් නිලධාරීන්ට බිය විය යුතු දෙයක් නොමැති බවත් ඔවුන්ට මෙම විරෝධතාවය සමනය කර ගැනීමේ හැකියාවක් තිබුණු බවත් ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දේ. මෙම නඩුවේ දෙවන වගඋත්තරකරු වන සීදූව පොලිසියේ ස්ථානාධිපතිවරයා ජනාධිපති පරීක්ෂණ කමිටුව ඉදිරියේ සාක්ෂි දෙමින් ද පවසා ඇත්තේ ජල ප්‍රහාරක රථ තිබුණි නම් මෙම තත්ත්වය ඉතා පහසුවෙන් පාලනය කර ගැනීමට තිබුණු බව යැයි ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි. දෙවන වගඋත්තරකරු තවදුරටත් එකී පරීක්ෂණ කමිටුවට කියා සිටින්නේ ඔහු කටුනායක පොලිස් ස්ථානයට යන විට කිසිදු ඉහළ පොලිස් නිලධාරියෙක් එහි නොසිටි බවත් එම නිසා තමා තීරණය කර වෙඩි තැබීමට අණ කළ බවත් ය. මෙම කරුණ පෙන්වා දෙමින් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරන්නේ පොලිසියේ ඉහළ නිලධාරීන්ගේ මෙම අකාර්යක්ෂමතාවය හා අසමත් බව මෙම තත්ත්වය වර්ධනය කිරීමට හේතු වූ බව යි.

ජනාධිපති පරීක්ෂණ කමිටුවේ සඳහන් මෙම විරෝධතාවයට පෙර පැවැති විරෝධතාවය පිළිබඳ ව හා ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ ව මෙහි ඉහත පොලිසියේ මර්දනකාරී ක්‍රියාකාරීත්වය පරිච්ඡේදයේ විස්තර කර ඇති පොලිස්පතිවරයාගේ මතය දක්වා සේවකයන්ට කර තිබූ නිවේදනය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණය කරුණු දක්වයි. එහි දී පැවැති නීතිවිරෝධී රැස්වීම හා නීතිය හා සාමය කඩ කිරීම පිළිබඳ ව ඔවුන් අසතුටු වන බවත් එමෙන් ම එවැනි නීති විරෝධී ක්‍රියා ඉදිරියේ දී නොඉවසන බවට එම නිවේදනයේ දක්වා තිබූ බවත් ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි. මෙම නිවේදනය අනුව පනතට විරෝධය දැක්වීමට සේවකයන්ට ඇති අයිතිය තීරණය වන්නේ එය අත්තනෝමතික යැයි පොලිසිය තීරණය කරන ප්‍රමාණය අනුව මිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පුරවැසියන්ට පැවරී ඇති සම්පූර්ණ ප්‍රමාණය අනුව නොවන බවට මෙම නිවේදනය මගින් පෙනී යන බව ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම රජයේ මූලික වගකීමක් බැවින් මෙහි වගඋත්තරකරුවන්ගේ ක්‍රියා සඳහා රජය වගකිවයුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරයි. එමෙන් ම මෙම පහරදීම් ඇතුළු සිදුවීම්වලට සම්බන්ධ පොලිස් නිලධාරීන්

නිසි ලෙස හඳුනා ගෙන නොමැති බැවින් පුද්ගලික වගකීම් පුද්ගලිකව නිලධාරීන් වෙත පැවරිය නොහැකි බව ද ශ්‍රේෂ්ඨාධිකරණය මෙහි දී පෙන්වා දෙයි.

එක් එක් පෙත්සම්කරුවන්ගේ කඩ වී ඇති බවට තීරණය කළ මූලික අයිතිවාසිකම් හා ගෙවීමට නියෝග කළ වන්දි.

SC FR 265/2011, 267/2011, 269/2011, 346/2011, 347/2011, හා 348/2011 යන පෙත්සම්හි පෙත්සම්කරුවන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11වන ව්‍යවස්ථාවෙන්, 12(1) ව්‍යවස්ථාවෙන් හා 14 (1) (ඇ) ව්‍යවස්ථාවෙන් සහතික කළ අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී.

SC FR 266/2011, 268/2011, හා 270/2011 යන පෙත්සම්හි පෙත්සම්කරුවන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන්, 12(1) ව්‍යවස්ථාවෙන්, 13 (1) ව්‍යවස්ථාවෙන් හා 14 (1) (ඇ) ව්‍යවස්ථාවෙන් සහතික කළ අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී.

SC FR 271/2011 පෙත්සමෙහි පෙත්සම්කරුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11වන ව්‍යවස්ථාවෙන් හා 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කළ අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී.

SC FR 272/2011, 273/2011, හා 274/2011 යන පෙත්සම්හි පෙත්සම්කරුවන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11වන ව්‍යවස්ථාවෙන්, 12(1) ව්‍යවස්ථාවෙන් හා 13 (1) ව්‍යවස්ථාවෙන් ව්‍යවස්ථාවෙන් සහතික කළ අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී.

මෙහි පෙත්සම්කරුවන්ට වන්දි ගෙවීමක් ද සිදු කළ යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළ අතර එකී වන්දි මුදලේ ප්‍රමාණය තීරණය කිරීමේ දී සිදු වී ඇති ශාරීරික හානිවල ප්‍රමාණය මෙන් ම මෙම විරෝධතාවයට සම්බන්ධ නොවී සිට ප්‍රහාරයන්ට ලක් වූ ඇතැම් පෙත්සම්කරුවන් පිළිබඳවත් විශේෂයෙන් සැලකිලිමත් වී ඇත.

ඒ අනුව SC FR 265/2011 පෙත්සමෙහි පෙත්සම්කරු වූ එච්. එම්. එම්. සම්පත් කුමාර යන අයට රු. 250,000/= ක වන්දි මුදලක්ද, SC FR 271/2011 පෙත්සම්කරු වූ නිශ්ශංක වනිගසේකර හා 273/2011 හි පෙත්සම්කරු වූ රන්ජන් ලසන්ත පෙරේරා යන අයවලුන්ට රු.100,000/= බැගින් වන වන්දි මුදලක්ද, SC FR 266/2011හි පෙත්සම්කරු වූ රෝහිත අමරසිංහ, 267/2011හි පෙත්සම්කරු වූ බුද්ධික අතපත්තු, 270/2011හි පෙත්සම්කරු වූ එන්. එල්. ටී. ඉරේෂා, 272/2011හි පෙත්සම්කරු වූ ජයතිස්ස රාජකරුණා, 346/2011හි ප්‍රදීප් කුමාර ප්‍රියදර්ශන හා 347/2011හි පෙත්සම්කරු වූ නලීන් සංජය ජයතිලක යන පෙත්සම්කරුවන්ට රු. 75,000/= බැගින් වන වන්දි මුදලක් ද, SC FR 268/2011හි පෙත්සම්කරු වූ ධනුෂ්ක සංජීව, 269/2011හි පෙත්සම්කරු වූ අනේෂ් ඉමල්ක ෆර්නෑන්ඩු හා 348/2011හි පෙත්සම්කරු වූ සමීර සඳරුවන් හෙට්ටිආරච්චි යන පෙත්සම්කරුවන්ට රු. 50,000/= බැගින් වූ වන්දි මුදලක් ද, SC FR 274/2011 පෙත්සමෙහි පෙත්සම්කරු වූ ලලින්ද හේරත් යන අයට රු. 40,000/= ක් වූ වන්දි මුදලක් ද ගෙවිය යුතු බවටත් එකී වන්දි මුදල් රජය මගින් ගෙවිය යුතු බවටත් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව තුළ සාකච්ඡා වූ කෘතියට අදාළ කර ගත් නඩු තීන්දු

1. ***Christians against Racism and Fascism V. United Kingdom*** (No. 8440/78, Commision decision of 16 July 1980, Decisions and Reports (DR) 21,p.138) - යුරෝපා කොමිසමේ තීන්දුවකි.

2. ***Ashok Kumar V. Delhi Administration and Others*** 1982 AIR 1143, 1982SCR (3) 707 – ඉන්දියානු නඩු තීන්දුවකි.

3. ***Nurettin Aldemir V. Turkey*** (Nos. 32124/02, 32126/02, 32129/02, 32132/02, 32133/02, 32137/02 and 32138/02, 18 December 2007) - මානව හිමිකම් පිළිබඳ යුරෝපා අධිකරණයේ (European Court of Human Rights) විභාග වූ නඩුවකි.

4. *බණ්ඩාර හා අනිත් අය එ. ජාගොඩ ආරච්චි, ස්ථානාධිපති, පොලිස් ස්ථානය කොටුව හා තවත් අය* (2000) 1 ශ්‍රී ලංකා නීති වාර්තා. 225

5. *සේනසිංහ එ. කරුණාතිලක, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නුගේගොඩ හා තවත් අය* (2003)1 SLR

6. *අමල් සුදත් සිල්වා එ. කොඩිතුවක්කු* (1987 2 SLR 119, 127)

7. *සෝමවර්ධන එ. බන්ධනාගාර අධිකාරී හා තවත්* (SC App 494/93 Spl SC Minutes 22 March 1995)

8. *වික්‍රමබන්දු එ. හේරත්* (SC Application 27/88 SC Minutes 6 April 1990)

9. *සංසදාස සිල්වා එ. අනුරුද්ධ රත්වත්තේ* (1998 1 SLR 250 පිටුව)

# පසුවදන

පුද්ගලික අංශය සදහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් යෝජනා කිරීම ඉතා වැදගත් කටයුත්තකි. නමුත් පසුගිය රජය විසින් කඩි මුඩියේ ඉදිරිපත් කළ යෝජිත විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත සත් චේතනාවකින් සිදු කළ කටයුක්තක් නොවන බව ඉතා කෙටි කාලයක් බොහෝ දෙනෙකුට වැටහී තිබුණි. රජයේ විසින් කඩිමුඩියේ ගෙන ආ මෙම විශ්‍රාම වැටුප් යෝජනාවේ යටි අරමුණ වී තිබුණේ දකුණු ආසියාවේ විශාල ම අරමුදල ලෙස සලකන සේවක අර්ථසාධක අරමුදලේ තිබෙන මුදල් කන්දරාව රජයේ ප්‍රයෝජනයට ගැනීම සඳහා මාර්ගයක් සකසා ගැනීම පමණක් විය.

මේ සම්බන්ධ ව පළමු විරෝධතාවය ඇති වුයේ වෘත්තීය සමිති ක්ෂේත්‍රයෙනි. ලංකා බැංකු සේවක සංගමය විසින් මෙම පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරනු ලැබූ නිසා රජයේ සැලසුම ඉන් අවුල් විය. එම නඩු විභාගය දිගින් දිගට ම කල්යාම නිසා අදාළ පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට නොහැකි විය.

මෙම යෝජිත විශ්‍රාම වැටුප් ක්‍රමය නිසා ඉන් වැඩි ම අවාසියට මුහුණ දෙන කොටස ලෙස හැඳින්වූයේ නිදහස් වෙළඳ කලාප ආශ්‍රිත සේවක, සේවිකාවන් ය. සාමාන්‍යයෙන් ඔවුන් අවුරුදු පහක් හෝ හයක් සේවයේ යෙදී සිට පසු ව සේවයෙන් ඉවත් වී ඔවුන්ගේ පාරිතෝෂික දීමනාව වන සේවක අර්ථසාධක අරමුදල් ලබාගෙන ඉදිරි ජීවිතය සැලසුම් කරයි. නව විශ්‍රාම වැටුප් ක්‍රමය නිසා ඉහත ඔවුන්ගේ පාරිතෝෂික දීමනාව අහිමි වන බව තේරුම් ගත් කටුනායක හා බියගම වෙළඳ කලාප සේවකයින් මෙම ක්‍රමයට එරෙහි ව විශාල විරෝධතාවයකට මුල පුරන ලදී.

කම්කරුවන්ගේ එම සමකාමී විරෝධතාවයට ඇහුම්කන් නොදුන් ආණ්ඩුව මෙම විරෝධතාවයන් පොලිසිය ඇතුළු ආරක්ෂක අංශ යොදා ඉතා කෲර ලෙස මර්දනය කිරීමට උත්සාහ කරනු ලැබූ අතර, එම හේතුවෙන් රොෂේන් චානක නැමති කටුනායක නිදහස් වෙළඳ කාලාපයේ සේවය කළ අහිංසක සේවකයකු මිය යන ලදී. එමෙන් ම

අත්තනෝමතික ලෙස කළ වෙඩි තැබීම් නිසා දහයකට ආසන්න පිරිසකට වෙඩි වැදී ඉන් කිහිප දෙනකු සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වූහ. තව ද පොලිසිය කළ ම්ලේච්ඡ පහරදීම් නිසා සියයකට වැඩි පිරිසක් තුවාල වූහ. සිදු වූ දේපළ හානිය කොතරම් ද යන්න තවමත් වාර්තා වී නොමැත. එමෙන් ම මේ හේතුවෙන් කටුනායක නිදහස් වෙළඳ කලාපය දින ගණනාවක් වසා දැමූ අතර ඉන් වූ පාඩුව ද මෙතෙක් ගණනය කර නොමැත.

මේ අතර මෙම කෲර ප්‍රහාරයෙන් මිය ගිය රොෂේන් චානක මහතාගේ අවමගුල් උත්සවය පවා ඔවුන්ගේ ඥාතීන්ට අවශ්‍ය පරිදි කර ගැනීමට නොහැකි විය. එවකට ආණ්ඩුව නියෝජනය කළ දේශපාලඥයින් රොෂේන් චානකගේ නිවසේ නැවතී සිටිමින් හා ආරක්ෂක අංශ හා බුද්ධි අංශ විශාල වශයෙන් එම ප්‍රදේශයේ යොදවමින් රොෂේන්ගේ ඥාතීන්ටත් අවමංගල උත්සවය සඳහා පැමිණෙන අන් අයටත් ඉන් විශාල පීඩාවක් ගෙන එන ලදී. ඉන් නොනැවතුණු මෙම දේශපාලනඥයින් උපක්‍රමික ව එදින හවසට යොදා තිබූ අවමංග්‍ය උත්සවය පල්ලියේ ද අනුග්‍රහය ඇති ව ඉතා හදිසියේ උදේ වරුවේ යොදවමින් අවමංගල උත්සවයට පැමිණෙමින් සිට රොෂේන් චානක සමඟ එකට වැඩ කළ සහෝදර කම්කරුවන් ඇතුළු ඔහුට අවසන් ගෞරව දැක්වීම සඳහා විවිධ පලාත් සිට පැමිණෙමින් සිටි විශාල කම්කරුවන් ඇතුළු සමාජ ක්‍රියාකාරීන්ටත් ඉන් විශාල අසාධාරණයක් සිදු කරනු ලැබීය.

කෙසේ හෝ කටුනායක නිදහස් වෙළඳ කලාප කම්කරුවන්ගේ මෙම ඓතිහාසික අරගලය නිසා ආණ්ඩුව විසින් ගෙන ඒමට උත්සාහ කරනු ලැබූ එම පුද්ගලික අංශය සඳහා වූ විශ්‍රාම වැටුප් පනත හකුලා ගැනීමට සිදු විය. එමෙන් ම මෙම ප්‍රහාරයේ වගකීම බාරගත් ප්‍රහාරයට අණදුන් බව ප්‍රකාශ කළ පොලිස්පතිවරයා ඉල්ලා අස් විය. නමුත් ඒ ඉල්ලා අස් වීම ඇස් බැන්දුමක් වූ අතර ඔහු එම සතිය තුළ ම බ්‍රසීලයේ තානාපති ලෙස රටින් පිට ව ගියහ. වෙඩි තැබීම සිදු කළ බවට වගකීම භාරගත් පොලිස් නිලධාරීන් දෙදෙනකු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන නඩු පවරනු ලැබීය. මේ සියල්ල නාට්‍යානුසාරයෙන් සිදු විය.

නමුත් මෙම කෲර ප්‍රහාරයට අණ දුන්නේ මෙම වගකීම භාරගත් පොලිස්පතිවරයා හෝ ආදාළ පොලිස් නිලධාරීන් දෙදෙනා නොවන බව අද මුළු රට ම දනී.

මෙම විශ්‍රාම වැටුප් අරගලය සඳහා කම්කරුවන් දැනුවත් කිරීමට හෝ ඔවුන් සංවිධානය කිරීමට හෝ අප ආයතනය කිසිම දායකත්වයක් සැපයුයේ නැත. අප මීට සම්බන්ධ වන්නේ මෙම අරගලය වාර්තා කරන්න එවකට අප නීති අංශයේ සිටි අශෝක මෙම උද්ඝෝෂණය ආවරණය කරන්න යැවීමත් හරහා ය. දහස් ගණන් කම්කරුවන් කටුනායක 18 කණුව අසලට රොක් වී විරෝධතාවයේ යෙදී සිටි අතරතුරේ දී එම ස්ථානයේ සවිකර තිබූ අඩි 80ක් පමණ උස හිටපු ජනාධිපතිගේ රුව රැගත් විශාල පුවරුවක් කඩා දමන අවස්ථාව ආවරණය කිරීමේ දී අපගේ කැමරාකරු ගැන සැක සිතූ කම්කරුවන් අපට මහමෙරක් මෙන් තිබූ අපේ අලුත් ම වීඩියෝ කැමරාව පොලොවේ ගසා කුඩුකර දැමීම තවමත් අපට අමතක කිරීමට නොහැකි වී තිබේ.


ඉන් පසු ව අප මැදිහත් වන්නේ මෙම කෲර ප්‍රහාරය නිසා තුවාල ලැබූවන්ට යුක්තිය ලබා දීම සඳහා යි. එසේ තුවාල ලැබූවන් 15 දෙනකුගෙන් පමණ තොරතුරු ලබා ගත්තත් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යන්න කැමැත්ත දක්වන්නේ ඉන් තිදෙනෙකු පමණි. ඒ තිදෙනා වෙනුවෙන් මූලික අයිතිවාසිකම් නඩු පැවරීම බාර ගන්නේ වර්තමානයේ ඕස්ට්‍රේලියාවේ මහකොමසාරිස් ලෙස කටයුතු කරනු ලබන ජේ. සී. වැලිඅමුණ මහතා විසිනි.

මේ අතර රොෂේන් චානකගේ මරණයට තුන්මසක් පිරීමත් සමඟ ම සිවිල් සංවිධාන එක් ව සංවිධානය කරනු ලබන ආගමික උත්සවයෙන් පසු ව එතනට පැමිණ සිටින සියලු ම සිවිල් සංවිධාන නියෝජිතයින් මෙම කෲර ප්‍රහාරයට විරෝධය පෑමටත්, මේ සම්බන්ධව නීතිය වහා ක්‍රියාත්මක කරන ලෙසටත්, මේ සම්බන්ධ ව සොයා බැලීමට පත්කළ ජනාධිපති කොමිසමේ වාර්තාව ප්‍රසිද්ධ කරන ලෙසත් ඉල්ලා සෑම මසක ම පළමුවන දා ඇවරියවත්ත පොලිසිය ඉදිරිපිට විරෝධතාවයක් පැවැත්වීමට තීරණය කරනු ලැබීය.

එතැන් සිට සෑම මසකම 1වන දා ඇවරියවත්ත පොලිසිය ඉදිරිපිට එම සමකාමී විරෝධතාව පැවැත්වූ අතර එය මගේ මතකයේ හැටියට අවුරුදු 4කට වැඩි කාලයක් අඛණ්ඩ ව පැවැත් වූ අතර එය ලංකාවේ එපමණ කාලයක් තිස්සේ මාසික ව සිදු කළ එක ම විරෝධතාවය වන්නටත් පුළුවන්.

මේ සම්බන්ධව සොයා බැලීමට පත්කළ ජනාධිපති කොමිසමේ වාර්තාවත් මෙම ප්‍රහාරයෙන් තුවාල ලැබූවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අප ඇතුළු අනෙකුත් වෘත්තීය සමිති විසින් ගොනු කරනු ලැබූ මූලික අයිතිවාසිකම් පෙත්සම් සියල්ල ජයග්‍රහණය කිරීමත් සමඟ ම එම නඩු තීන්දු ද ඇසුරින් මේ සම්බන්ධ ව යම් විමර්ශනයක් කිරීමට අප තීරණය කළෙමු. එම වගකීම නීතිඥ දුලාන් දසනායක මහතා විසින් භාරගන්නා ලදී.

**පිලිප් දිසානායක**
විධායක අධ්‍යක්ෂ
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය
24/10/2019



“

රාජ්‍යය මූලික අයිතිවාසිකම්වල
ආරක්ෂකයා වන බවත් එම නිසා
මෙවැනි යම් කැරලිකාරී
අවස්ථාවක් එළඹෙන විට මනුෂ්‍ය
ජීවිතවලට හා දේපළට අවම
හානියක් වන පරිදි එය සමනය
කිරීමට සියලු පූර්ව ආරක්ෂක
විධිවිධානයන් යෙදීමට
රජයට වගකීමක් ඇත.

”

උපුටා ගැනීම - FTZ අරගලයට යුක්තිය ඉටු කළ
ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවෙන්


RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

අංක 07, කෝපියාවත්ත පාර, කොළඹ 09, ශ්‍රී ලංකා.
දුරකථන/ෆැක්ස්: +94 11 266 9100
ඊමේල්: right2lifelk@gmail.com
වෙබ්: www.right2lifelanka.org
Right to Life Sri Lanka



මිල රු. 100/=